# භාෂා අයිතිය
# හා
# පුරවැසි ප්‍රවේශය

(2011 - 2014 දක්වා භාෂා වැඩසටහන් සමාලෝචනය)

Centre for Policy Alternatives

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

**භාෂා අයිතිය හා පුරවැසි ප්‍රවේශය**

ප්‍රථම මුද්‍රණය 2014 දෙසැම්බර්

ISBN - 978-955-0000-00-0

පරිගණක නිමැවුම : **වාක්‍යා රූ 011-2708377**

මුද්‍රණය : **ග්ලෝබ් ප්‍රින්ටින් වර්ක්ස් දු.ඇ. 0777-315971**

ප්‍රකාශනය : **විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය**

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන දේශපාලන පක්ෂවාදීත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිටුවනු ලැබුයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වු කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවී දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතු ව පවතින බවට වන දැඩි විශ්වාසය පෙරදැරි කොටගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක ව විමර්ශනයට භාජනය කරන, විකල්පයන් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැප වී සිටී.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
24/2, 28 වෙනි පටුමග, මල් පාර, කොළඹ 07, ශ්‍රී ලංකාව.
දුරකථනය 94-11-2565304/06 ෆැක්ස් 94-11-4714460
ඊ-මේල් cpa@cpalanka.org වෙබ් www.cpalanka.org

# භාෂාව හා සමගි සන්ධානය

පශ්චාත් යුධ සමයක සිට ගැටුමේ මූලාශ්‍රයන් ධරණීය තත්ත්වයකට හෝ නැතහොත් ගැටුම්කාරී තත්ත්වයක් නැවත ඇති නොවන සමගි සන්ධානය කරා ළඟා වන තත්ත්වයන් වෙත ශ්‍රී ලංකාව ප්‍රවේශ විය යුතු ය. එසේ වීමට නම් භාෂා ප්‍රශ්නය පිළිබඳ දැඩි අවධානයක් යොමු කළ යුතු යැයි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය දැඩි විශ්වාසයක සිටියි. වාර්ගික ගැටුමේ කේන්ද්‍රීය ස්ථානයක් ලෙස භාෂාව පවතින නිසා, භාෂා ප්‍රශ්නය පිළිබඳ ව අවධානය යොමු කිරීම ශ්‍රී ලාංකේය ජනතාවට ඉතා වැදගත් වන්නා සේම එය ක්‍රියාකාරිත්වයේ දී තීරණාත්මක සංකේතයක් ද වන්නේ ය. මෙය මූලික වන අතර ම යොදවනු ලබන සම්පත් සමස්ත ප්‍රජාවගේ විශ්වාසනීය භාවයත් තමන් තුළ ස්ථාපිත කරමින් සැබෑ මානව ගරුත්වය සහ විශ්වාසය ස්ථාපිත කරීම කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගු කාලීන වශයෙන් ළඟා කරගනු ලබන යහපත් දේට වඩා අධික වටිනාකමක් දරයි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය භාෂා අයිතිවාසිකම් පිළිබඳ වැඩසටහන ඔස්සේ වෙනසක් ඇති කිරීමට වෙහෙස දරයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල තම අයිතිවාසිකම් සපුරා ගැනීමේ ක්‍රියාකාරිත්වයට පුරවැසියන් යොදවන අතර, ඒ ඔස්සේ පුරවැසියන් ලෙස යුතුකම් හා අයිතිවාසිකම් රැකගැනීම ගැනත් ඔවුන්ගේ වගකීම් ඉටුකිරීම ගැනත් අවධානය යොමු කෙරේ. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී රාජ්‍ය අංශයෙන් ලැබුණු සහයෝගය අගය කරමු. භාෂා අයිතිවාසිකම් ප්‍රතිපත්තිමය වශයෙන් ප්‍රමුඛත්වයක් ලබාදීමටත්, ඊට අදාළ සම්පත් එකී අයිතිවාසිකම් වෙනුවෙන් ලබාදීමත් රජයේ යුතුකම වන්නේ ය. ආයතන පාලනයේ දී මෙන් ම ආණ්ඩුකරණයේදී ද භාෂා අයිතිවාසිකම් එහි අන්තර්ගත කිරීමටත්, ප්‍රතිවිරෝධතාවයන්, අඩු පුරවැසි තත්ත්වයන් හා කොන් කරනු ලැබීම යන හැඟීම් සඳහා භාෂ අයිතිය මූලාශ්‍රයක් කරගත යුතු නැතැයි ද විශේෂයෙන් සඳහන් කරන අතර මෙවැනි යහපත් සංස්කෘතියක් වෙත අවසානයේ දී ළඟා වීම මෙහි අරමුණ වන්නේ ය.

වැඩසටහනක් ලෙස මේ සඳහා යම් මාවත් කීපයක් අප විසින් සැළසුම් කරන ලදැයි අප විශ්වාස කරමු. ශ්‍රී ලංකාව තම සම්පූර්ණ හැකියාවන් යොදා ගැනීමට නම් බොහෝ දුර අපට ගමන් කළ යුතු ව තිබේ යැයි විශ්වාස කරමු.

**ආචාර්ය පී. සරවනමුත්තු**
විධායක අධ්‍යක්‍ෂ
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

# භාෂා අයිතිවාසිකම් සුරකින
## පුරවැසි සමාජයක්

භාෂාව අදහස් පළ කිරීමේ යානය යි. එහෙත් අදහස් පළ කිරීම යන්නෙහි ඇත්ත අරුත පුද්ගලයන් අතර කෙරෙන අදහස් හුවමාරුවකට සීමා නොවේ. සම්භාෂණයේ නිදහසට කුමන හෝ හේතූන් මත බාධා පැමිණීම විචාරයට සහ බුද්ධි මාර්ගයට ඇති ඉඩකඩ ඇහිරීමකි. මානව චින්තනය අන්ධකාරයට හෙළීමකි.

ජාතීන් වශයෙන් මිනිසුන් වර්ග කිරීමේ දී භාෂාමය හා සංස්කෘතිමය වෙනස සැලකිල්ලට ගැනේ. එහෙත් තමන් වහරන භාෂාව නිසා කිසදු ජාතියක් වෙනත් ජාතියකට වඩා උසස් හෝ පහත් ලෙස සැලකීම යුක්ති සහගත නොවේ. මෙසේ වෙනස් කොට සැලකීම රුධිර ගංගා ගැලීමට හේතුවන බිහිසුණු ප්‍රචණ්ඩත්වයක් කරා ද වර්ධනය විය හැකි ය.

නිදහසෙන් පසුව අප රටේ බොහෝ වෙනස්කම් සිදු වුව ද ජාතික එක්සත්කම ගොඩ නැගීමට අසමත් වීමේ අනර්ථකාරී ප්‍රතිපල සියලු ජනවර්ගවගට අයත් ජනතාව භුක්ති විඳී. ජාතික එක්සත්කම ගොඩනැගීමේ දී රට තුළ ජීවත්වන සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ හා තෙලිඟු යනාදී ජාතීන් කතා කරන භාෂාවන් සම තැන්හිලා සැලකීම යුග අවශ්‍යතාවකි.

සිංහල හා දෙමළ භාෂා රාජ්‍ය භාෂා වශයෙන් ව්‍යවස්ථාව මගින් ම පිළිගන්නා රටක භාෂා ප්‍රශ්නය නිසා පීඩා විඳින ජන කොටස් ජීවත් වීම රට ඉදිරියට ගෙන යෑම සඳහා බාධාවක් ව පවතී. ව්‍යවස්ථා විධිවිධාන, චක්‍ර ලේඛ හා කැබිනට් තීන්දු අනුව දෙමළ හා සිංහල භෂා සමතන්හි ලා පිළිගැනේ. එහෙත් රජයේ කාර්යාලයකට අවශ්‍යතාවක් ඉටුකර ගැනීමට යන දෙමළ ජාතිකයෙකු හට අදාල ලේඛන උපදෙස් හෝ ඉල්ලුම්පත් යනාදිය ලබා දෙන්නේ සිංහල භාෂාවෙනි. දෙමළ භාෂාව කථා කරන අයකුට අවශ්‍ය සේවා සැපයීමේ පහසුව සඳහා දෙමළ භාෂාව දන්නා නිළධාරියකු සේවයෙහි යොදවා ගත යුතු ය යනුවෙන් ව්‍යවස්ථාමය විධි විධාන පනවා ඇත.

# ව්‍යවස්ථා විධි විධාන

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 22(1) අනුව සිංහල සහ දෙමළ භාෂා ශ්‍රී ලංකාව මුළුල්ලේ ම පරිපාලන භාෂා බවට පත් වෙයි. රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 03/2010 මගින් රාජ්‍ය ආයතන විසින් ලිපි ගනුදෙනු කිරීමේ දී අනුගමනය කළ යුතු භාෂා විධිවිධාන සම්බන්ධයෙන් නැවත වරක් අවධාරණය කර ඇත. ලිපි එවනු ලබන භාෂා මාධ්‍යයෙන් ම (සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි) පිළිතුරු යැවීම සඳහා රාජ්‍ය ආයතනවලට නිර්දේශ කෙරේ. පිළිතුරු ලිපිය අත්සන් කරන නිළධාරියාට එම භාෂා මාධ්‍ය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් නොමැති නම් ඔහුට හුරු රාජ්‍ය භාෂාවකින් ලිපිය අත්සන් කර, ලද ලිපියේ භාෂා මාධ්‍යයෙන් පරිවර්තනය කර යැවීම කළ යුතු බවත් චක්‍ර ලේඛ වැනි පොදු උපදෙස් නිකුත් කිරීමේ දී භාෂාත්‍රයෙන් ම කළ යුතු බවත් එම චක්‍ර ලේඛයෙහි ම සඳහන් වේ. රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 15/2009 මගින් රජයේ උසස් නිළධාරීන්ට දැනුම් දී ඇත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ භාෂාව පිළිබඳව ඇති විධිවිධාන ක්‍රියාත්මක කරන ලෙස ඇති චක්‍ර ලේඛ ක්‍රියාත්මක කිරීමට වග බලා ගන්නා ලෙස ය.

''සෑම නිළධාරියෙකු ම සේවයට/තනතුරට පත් වී වසර 5 ක් තුළ අදාළ තනතුරට නියම කර ඇති දෙවෙනි භාෂා ප්‍රවීනතාව (තනතුරට නියමිත මට්ටමට) ලබා ගත යුතු ය. නියමිත කාලය තුළ ප්‍රවීනතාව ලබා නො ගන්නා නිළධාරීන්ගේ වැටුප් වර්ධක විලම්භනය වේ'' යනුවෙන් ආයතන සංග්‍රහයේ 11 පරිච්ඡේදයට 12:11:2 ලෙස නව උප වගන්තියක් ඇතුළත් කර ඇත්තේ රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 07/2007(1) මගිනි. මෙ බඳු චක්‍ර ලේඛ ගණනාවක් මගින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රජයේ ආයතනවලට දැනුම් දී තිබේ. 2008 අප්‍රියෙල් මස 09 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී ''සිංහල භාෂා පාඨ පමණක් යෙදූ රජයේ වැඩසටහන් හා ව්‍යාපෘති සඳහා දෙමළ භෂා පාඨ ද යෙදීමේ අවශ්‍යතාව'' පිළිබඳ තීන්දුවක් ගන්නා ලදි. සිංහල පාඨ සඳහා යොදා ගන්නා දෙමළ සහ ඉංග්‍රීසි පාරිභාෂික වදන් සැකසීමේ කාර්යය සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ සහය ලබාගැනීමට ද එහි දී තීන්දු කෙරිණි. එමෙන් ම සියලු ම රාජ්‍ය ආයතන හා රජයට අනුබද්ධ ආයතන මගින් ආරම්භ කෙරෙන ව්‍යපෘති සඳහා යොදා ගැනීමට අපේක්ෂා කරන හැඳින්වීමේ නාම සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන් ම සකස් කිරීම සඳහා අදාළ ආයතන වෙත සහය ලබා දීමේ කාර්යය පැවරුණේ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවට ය. 2010 දී ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය පිහිටුවීමෙන් පසුව ජාතික භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට වග බලා ගැනීමේ යම් උනන්දුවක් ඇති විය. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, රාජ්‍ය භාෂා කොමිසම, ජාතික භාෂා අධ්‍යයන පුහුණු ආයතනය යනාදී ආයතනවලට අමාත්‍යාංශයේ විෂය පථයට අයත් කාර්යයන් ඉටු කිරීමේ වගකීම පැවරේ.

''සියලු සමාජ කොටස්හි සංස්කෘතික අනන්‍යතාව සනාථ කරලමින් ද්විභාෂාවෙන් හෘදයාංගම ව බැඳුණු විවිධත්වය තුළ එකමුතු බව සමරන්නා වූ ජාතියක් ගොඩ නැංවීම අපගේ දැක්ම ය'' යනුවෙන් ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍ය වාසුදේව නානායක්කාර මහතා සඳහන් කර ඇත. ජාතික එක්සත්කම ඇති කිරීමේ දී භාෂා අයිතීන් අරාක්‍ෂා කිරීම සම්බන්ධයෙන් ඔහු තුළ ඇති සංවේදී බව අගය කළ යුතු ය. එමෙන් ම එම අමාත්‍යංශය මගින් සාධනීය පියවර රැසක් ගෙන ඇති බව පෙනේ. එහෙත් ක්ෂේත්‍රයේ අත්දැකීම් අනුව අපට හැඟී යනුයේ විවිධ හේතූන් මත රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීමේ දෝෂ ඇති වී තිබෙන බව ය.

## භාෂා සංගම්

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සුළුතර ජාතීන්ගේ භාෂා අයිතීන් තහවුරු කිරීමේ, ප්‍රවර්ධනය කිරීමේ හා බල ගැන්වීමේ වැඩසටහනක් ආරම්භ කළේ 2011 වසරේ දී ය. ක්ෂේත්‍ර සමීක්ෂණවල දී පෙනී ගිය මූලික කරුණක් වන්නේ භාෂාමය ගැටලුවලට මුහුණ දෙන පුරවැසියන් තුළ භාෂා අයිතිවාසිකම පිළිබඳවත්, එය කඩවන විට ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳවත් අවබෝධයක් නොමැති බව ය. භාෂා අයිතිවාසිකම් කඩ වූ විට මානව හිමිකම් කොමිසම හා රජ්‍ය භාෂා කොමිසම යනාදී ආයතන වලට පැමිණිලි කිරීමේ හැකියාව ඇතත් ඒ බව දැන සිටියේ ස්වල්ප දෙනෙකි. දිගු කලක් යුද්ධයකට මුහුණ දීම නිසා ඇති වී තිබෙන කම්පනය හා බිය හේතුවෙන් රාජ්‍ය ආයතනයකට එරෙහිව පැමිණිලි කිරීමේ බියකින් ද පුරවැසියන් පෙළෙන බව උතුරු නැගෙනහිර පළාත්වල ක්ෂේත්‍ර අත්දැකීම්වලින් පැහැදිලි විය. භාෂා සංගම් පිහිටුවීමේ දී පුරවැසියන් සමඟ මේ සම්බන්ධයෙන් කතිකාවතක් ගොඩ නැගීමේ අවස්ථාව ලැබුණි. ආරක්ෂක අංශවලින් පශ්න කරනු ලැබීම, භාෂා සංගම්වල ක්‍රියාකාරිකයන් සිත්හි චකිතයක් ඇති කර තිබෙන බව ද පෙනී ගිය කරුණකි. කෙසේ වුව ද භාෂා සංගම් ක්‍රියාකාරිකයන්ගේ අවබෝධය කෙමෙන් පුළුල් වන විට ඔවුන්ගේ මැදිහත් වීම් සාධනීය ක්‍රියාවලියක් බවට පත් විය.

## රාජ්‍ය ආයතනවල පසුගාමී බව

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ විධිවිධාන පිළිබඳ ව ඇතැම් නිළධාරීන් හා බලධාරීන් දක්වන නොසැලකිල්ල හා උදාසීනකම ද මෙහි දී කැපී පෙනේ. යාපනය විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරයකු වන ගුරුබරන් මහතා මුහුණ දුන් සිදුවීම එක් උදාහරණයකි. දිනක් ඔහු තම මෝටර් රථයෙන් ගමනක් යද්දී මාර්ග නීති කඩ කර ඇතැයි පොලීසියේ රථ වාහන පරීක්ෂණ නිළධාරියෙක් දඩ කොළයක් ලියා දුන්නේ ය. එය ලියා තිබුණේ සිංහල බසිනි. තමා දෙමළ ජාතිකයෙකු වන හෙයින් දෙමළ භාෂාවෙන් දඩ කොළය ලියා දෙන මෙන් ගුරුබරන් මහතා පොලිස් නිළධාරියාට ප්‍රකාශ කළේ ය. එහෙත් එය ඉෂ්ට නොවී ය. දෙමළ ජාතිකයකු හට දෙමළ භාෂාවෙන් අවශ්‍යතා ඉෂ්ට කරදීම සම්බන්ධයෙන් ඇති නිර්දේශ පිළිබඳ ගුරුබරන් මහතා පොලිස් ස්ථානාධිපතිවරයාට පැහැදිලි කළේ ය. තමන්ට එවැනි උපදෙසක් ලැබී නැතැයි යනු පොලිස් ස්ථානාධිපතිවරයාගේ පිළිතුර විය. කථිකාචාර්යවරයා පොලීසියට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයෙහි නඩුවක් පැවරීය. අධිකරණය එම නඩුව සමථයකට පත් කළේ ය. මෙහි දී පොලිස් නිළධාරීන් දැන හෝ නොදැන කර ඇත්තේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය කඩ කිරීමකි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ ද ආයතන සංග්‍රහය ද නොසලකා හැර කටයුතු කිරීමකි.

දෙමළ ජනතාව බහුතරයක් ජීවත්වන ප්‍රදේශවල පොලීසියට ඉදිරිපත් කෙරෙන පැමිණිලි සිංහල භාෂාවෙන් සටහන් කර ගැනීම නිසා සිදුවන ව්‍යාකූල බව හේතුවෙන් දෙමළ ජනතාව අධිකරණයෙන් සාධාරණය ඉෂ්ට නොවීමේ ශෝචනීය තත්ත්වයට දිගු ඉතිහාසයක් පවතී. සෑම පොලිස් ස්ථානයක් සඳහා ම දෙමළ භාෂාව දන්නා පොලිස් නිලධාරීන් ද බඳවා ගත යුතුව බවට තීන්දු කිරීම, රජය විසින් ගනු ලැබූ සාධනීය පියවරක් හැටියට මීට වසර කිහිපයකට පෙර බහු ප්‍රචාරයට පත් විය. එහෙත් එය ක්‍රියාවට නැගුණේ මන්දගාමී අයුරිනි. එය නිසි පරිදි ක්‍රියාත්මක වූයේ නම් කථිකාචාර්ය ගුරුබරන්ට දඩ කොළයක ප්‍රශ්නය මුල්කරගෙන අධිකරණයෙහි පිහිට පතන්නට සිදු වන්නේ නැත. යාපනයෙහි සමාජ ක්‍රියාකාරිණියක වූ ලෝගේස්වරන් මහත්මිය වරක් මෙසේ ප්‍රකාශ කළා ය.

''යුද්දෙ තදින් අවිළුණු කාලෙ දවසෙ වැඩි කාලයක් ඇඳිරි නීතිය පැන වුණ නිසා, දෙමළ පවුල්වල පිරිමින්ට කිසිදු ජීවන කර්මාන්තයක යෙදීමට නොහැකි වුණා. මේ නිසා අඹුදරුවන් බඩ ගින්නේ ඉඳිනු බලා ඉන්නට නොහැකි ව සමහර පිරිමින් වන්නියට ගියා. එහෙම ගියපු අයගෙන් සමහරු නැවත ආවේ නැහැ. මේ ගැන පැමිණිලි කරන්න පොලීසියට ගිය කාන්තාවන්ගේ පැමිණිලි සිංහලෙන් ලියා ගැනීමේ දී තොරතුරු විකෘති වුණා. මේ නිසා, එම කාන්තාවන්ට යුක්තිය ඉෂ්ට උනේ නෑ.'' යුද සමයෙහි අත්දැකීම් එපරිදි ය. යුද්ධය අවසන් වීමෙන් පසු ව ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා විසින් පත් කරන ලද උගත් පාඩම් කොමිසම සිය වාර්තාවෙහි මෙසේ සඳහන් කර ඇත.

''රජයේ සියලු කාර්යාලයන්හි දෙමළ කතා කරන නිළධරයන් සිටීම අනිවාර්ය කළ යුතු ය. පොලීසිවල 24 පැයේ ම සිටිය යුත්තේ පැමිණිලි කරුවන්ට තමන්ගේ භාෂාවෙන් එය සටහන් කරවා ගැනීමේ අයිතිවාසිකම තිබිය යුතු නිසා ය. (9.247)

කොමිසම මෙසේ නිර්දේශ කර ඇත්තේ තමන් හමුවේ සාක්කි දුන් දෙමළ පුරවැසියන්ගේ දුක් ගැනවිලි වලට ප්‍රතිචාරයක් වශයෙනි. තතු මෙසේ තිබිය දී මීට මාස කිහිපයකට පෙර රූපවාහිනී සාකච්ඡාවකට එක් වූ ද්‍රවිඩ සන්ධාන මන්ත්‍රීවරයකු කියා සිටියේ රජය කුමක් ප්‍රකාශ කළ ද දිවයිනේ කිසි ම පොලිස් ස්ථානයක සේවය සඳහා දෙමළ බස කථා කරන පොලිස් නිලධාරීන් බඳවාගෙන නොමැති බව ය. මෙහි දී එම සාකච්ඡාවට දුරකථනයෙන් සම්බන්ධ වූ පොලිස් මාධ්‍ය ප්‍රකාශකයා දෙමළ සන්ධාන මන්ත්‍රීවරයාට අභියෝගයක් කළේ ය. එනම් දෙමළ බස කථා කරන පොලිස් නිලධාරියකු සේවයෙහි යොදවා නොමැති පොලිස් ස්ථානයක් වේ නම් එය පෙන්වා දෙන ලෙස ය. මෙ වැනි වාග් හරඹ දියත් වුව ද ප්‍රශ්නයෙහි නියම ස්වරූපය එයින් පිළිබිඹු නොවේ. දෙමළ බස කථා කරන පොලිස් නිලධාරීන් සෑම පොලිස් ස්ථානයක ම සේවයට බඳවා ගැනීමේ කාර්යය ආරම්භ වී ඇතත්, එය සීයට සීයක් සාර්ථක වී නොමැත. යාපනය දිස්ත්‍රික්කයේ තෙලිප්පිලෙයි පොලීසිය සහ අම්පාර ද්ස්ත්‍රික්කයේ පොතුවිල් පොලීසිය ද්වි භාෂා ප්‍රතිපත්තිය සාර්ථකව ක්‍රියාත්මක කරන පොලිස් ස්ථාන දෙකකි. නාම පුවරු භාෂා තුනෙන්ම ප්‍රදර්ශනය කිරීම හා දෙමළ ජාතිකයන්ගේ පැමිණිලි දෙමළ භාෂාවෙන් ලියා ගැනීම මෙම ආයතනවල සාර්ථක අන්දමින් ඉෂ්ට වේ. එහෙත් මන්නාරම, වව්නියා සහ මඩකලපුව යන දිස්ත්‍රික්කවල තත්තවය මීට වෙනස් ය.

මාර්ග නීති කඩ කළේ යැයි යතුරු පැදියකින් ගමන් කළ මුස්ලිම් තරුණයෙකු හට වවුනියාව පොලීසියේ නිලධාරියෙක් සිංහලෙන් දඩ කොළයක් ලියා දුන්නේ ය. එහි සඳහන් වන්නේ මොනවාදැයි මුස්ලිම් තරුණයා ඇසූ පැනයට පොලිස් නිලධාරියා පැහැදිලි උත්තරයක් නොදුන්නේ ය.

රාජ්‍ය ආයතනවල භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ස්වභාවය පරීක්ෂා කිරීම සඳහා භාෂා විගණනයක් සිදු කිරීමේ අවශ්‍යතාව කලක පටන් පවතී. එවැනි පසු විපරමක් සිදු කළ විට, අඩුපාඩු මග හරවා ගැනීම සඳහා පිළියම් යෙදීමේ අවස්ථාවක් ලැබෙනු ඇත. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 35ක් ආවරණය වන පරිදි භාෂා විගණනයක් සිදු කළේ එම අවශ්‍යතාව සැළකිල්ලට ගැනීමෙනි. මෙය ජාතික මට්ටමින් සිදු කළ යුතු කාර්යයක් බව අවධාරණය කළ යුතු ය.

# භාෂා හා සංස්කෘතික උරුමය

සිංහල බස කතා කරන බහුතරයක් ජීවත්වන රටක් වුව ද දිගු ඉතිහාසයක් මුළුල්ලේ සිංහල සහ දෙමළ ජනතාව භාෂාමය හා සංස්කෘතිමය වශයෙන් අන්‍යෝන්‍ය වශයෙන් පෝෂණය වෙමින් එකට ජීවත්වීමේ හුරුව අත් පත් කරගෙන ඇත. බෙදා වෙන්කොට පාලනය කිරීමේ දේශපාලන තීන්දු හේතුවෙන් ගැටලුකාරී තත්ත්වයන් උද්ගත වීම නිසා බෙදා හදාගෙන ජීවත් වීමේ අතීත පුරුද්ද පළුදු විය. සිංහල සහ දෙමළ ජාතීන්ගේ නිජබිම් සංකල්පය කූට බුද්ධිමතුන් විසින් ඉස්මතු කරනු ලැබුව ද භාෂා දෙක සම්මිශ්‍ර වීමෙන් ඒ භාෂා දෙකම පෝෂණය වී අනන්‍යතාවන් ද ආරක්ෂා කර ගෙන සිටී. හින්දු සහ බෞද්ධ සංස්කෘතීන්හි සම්පර්කය ද එලෙස ය. සිංහල සහ දෙමළ භාෂා සංස්කෘතික සම්පර්කය ගසට පොත්ත මෙනි. අදූරදර්ශී දේශපාලන හා පරිපාලන තීන්දු නිසා මුළුමනින් ම යටපත් කිරීමට නොහැකි වූ මේ ඓතිහාසික සත්‍යය වෙනුවෙන් අප පෙනී සිටිය යුතු ය. එහි දී පුරවැසියාගේ පාර්ශ්වයෙන් ඇති කළ යුතු වෙනස්කම් සහ පෙළඹවීම් පිළිබඳ සංවේදී වීම අවශ්‍ය වේ. පුරවැසියා සවිබල ගැන්වීම අනුව අයිතිවාසිකම් දිනා ගැනීමේ ක්‍රියාවලිය පල දරනු ඇත. පුරවැසියා යනු හුදෙකලා සත්වයකු නොවේ. පක්ෂ, ප්‍රාදේශීය වාද හා කුලය යනාදී වශයෙන් භේද බින්නතා තිබුණ ද අතීත සමාජයෙහි මෙරට පුරවැසි ක්‍රියාකාරිත්වය පිළිබඳ සාධනීය ලක්ෂණ හඳුනා ගත හැක්කේ සමූහිකත්වය ඔස්සේ ජන දිවියෙහි අවශ්‍යතා ඉෂ්ට කර ගැනීමෙහිලා දක්වන ලද උනන්දුවෙනි. එකල පැවතුණේ කෘෂක සමාජයකි. අවශ්‍යතා ද සීමා සහිත විය. වත්මනෙහි ජීවත් වන්නේ නවීන පුරවැසියෙකි. එහෙත් ජීවන පරමාර්ථ සාධනය කරගැනීමේ රළු ස්වභාවයත් තරගකාරිත්වයත් අනුව පුරවැසියා හුදෙකලා අරගලකරුවකුගේ ස්වභාවයකට පත්ව තිබේ.

රාජ්‍ය ව්‍යුහයන් ගම තුළ ක්‍රියාත්මක වීමේ දී ඒවා නිසි ඉලක්ක කරා නොයෑමේ සහ අනර්ථකාරී ප්‍රතිපල අත්කර දීම කෙරෙහි බලපාන ප්‍රධාන කරුණක් ව ඇත්තේ පුරවැසියා හුදෙකලා මිනිසෙකු බවට පත්වීමයි. එහෙත් සාමූහික කතිකාවතක් යනු පුරවැසියා සතුව නිදන්ගතව පවතින විභව ශක්තීන් පුබුදු කිරීමේ නිසැක මගකි. අප විසින් දිවයිනේ තෝරාගත් දිස්ත්‍රික්ක කිහිපයක පුරවැසි සභා පිහිටුවීම ආරම්භ කර ඇත්තේ දියුණු පුරවැසි සමාජයක් නොමැති සමාජයක ක්‍රියාත්මක කෙරෙන ජන හිතකාමී කවර හෝ වැඩ සටහන් හිල් වූ බඳුනකට වතුර දැමීමේ දී අත්වන ප්‍රතිපලයට සමාන ප්‍රතිපලයක් අත්පත් කර ගන්නා බව ප්‍රත්‍යක්ෂ කර ගැනීම අනුව ය. අනාගතයෙහි පුරවැසියාගේ භාෂා අයිතිවාසිකම් දිනා ගැනීමේ ක්‍රියාවලිය සාර්ථක වනු ඇත්තේ එය පුරවැසි සභා ව්‍යුහයක් තුළ ක්‍රියාත්මක වන විට ය.

**ලයනල් ගුරුගේ**
ජ්‍යෙෂ්ඨ පර්යේෂක
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

# පටුන


භාෂාව මූලික මානව හිමිකමකි 10

ව්‍යවස්ථාමය විධි විධාන 12

භාෂා සංගම්වල ක්‍රියාකාරිත්වය 15

භාෂා අයිතිවාසිකම් කඩවීම සම්බන්ධව ශ්‍රී ලංකා රාජ්‍ය භාෂා කොමිෂන් සභාවට හා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම වෙත විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ඉදිරිපත් කළ පැමිණිලි 22

අධිකරණ හා කොමිෂන් සභා තීන්දු 30

ශ්‍රී ලංගම බස් රථ, පෞද්ගලික බස් රථ හා දුම්රිය නිවේදන ආදියෙහි ද්වී භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීම පිළිබඳව සකස් කරන ලද සමීක්ෂණ වාර්තාව 34

භාෂා හා සංස්කෘතික සබඳතා තහවුරු කිරීම 65

විලාසම : ලිපිනය අභිමි වතු ජනයාට ලිපිනයක් 67

පුරවැසි සභාව පුරවැසියන් බලගැන්වීමේ ප්‍රවේශයක් 69

යෝජනා හා නිර්දේශ 71





# භාෂාව
## මූලික මානව හිමිකමකි

කුඩා දරුවකු කෙමෙන් වැඩෙන විට තම දිවියෙහි වැදගත් කඩ ඉමක් පසු කරයි. ඒ වනාහී 'බහ තෝරන' අවධිය යි. 'බහ' යනු භාෂාව යි. වැඩෙන කුඩා දරුවා තෝරන්නේ, වටහා ගනිමින් සිටින්නේ තම මව් බසයි. සිංහල පවුලක උපන් දරුවකු 'තෝරන' 'බහ' සිංහල බසයි. දෙමළ, චීන, රුසියන් යන කවර බසක් කතා කරන පවුලක උපන් කවර හෝ දරුවකුට මෙය පොදු සත්තාවකි.

සිංහල දරුවකු උපන් පසු දෙමළ පවුලක හැදී වැඩුණේ යැයි සිතමු. එවිට එම දරුවා තෝරන 'බහ' දෙමළ බසයි. එනම් එම දරුවාගේ මව් බස දෙමළ යි.

මේ කරුණු අනුව පෙනී යන්නේ මෙලොව කුමන රටක කුමන හෝ පවුලක උපදින දරුවකුට 'මව් බසක් ' නිසගයෙන්ම උරුම වන බව යි. තම මව් බසින් අදහස් පළකිරීම ඒ බස කතා කරන දරුවාගේ අයිතියකි. එය ඔහු හෝ ඇය හැදී වැඩී මිය යන තෙක්ම උරුමයක් ව පවතී. එහෙයින් එය මානව අයිතිවාසිකමකි. වඩාත් සවිස්තරව හඳුනා ගත හොත් මූලික මිනිස් අයිතිවාසිකමකි.

පුද්ගලයෙකුගේ අනිකුත් සියලු අයිතීන් තහවුරු කෙරෙන වාහකයා වන්නේ ද තමන්ට උරුම වූ හා ප්‍රිය වූ ද අර්ථ සිද්ධි සලසන්නා වූ ද මව් බස යි.

පුද්ගලයකුට උපතින් උරුම වන මේ භාෂා අයිතිවාසිකම හා, එය කඩ නොකිරීමට වග බලා ගැනීම අනෙකාගේ වගකීම හා යුතුකම යි. එම භාෂා අයිතිවාසිකම අහිමි කරනු ලැබීම, වේදනාවට හේතුවකි. නොසලකා හැරීමකි. සමාජමය පිටමං කිරීමකි. සංවිධානාත්මක බල ප්‍රවාහයකින් එම භාෂා අයිතිවාසිකම උදුරා ගනු ලැබූ කල්හි එය දරුණු සමාජ ගැටුමකට හේතුවෙයි. මේ පිළිබඳව සමීප අත්දැකීම්, ලොව බොහෝ ජන සමාජවලට මෙන් ම ශ්‍රී ලාංකිකයන් වන අප හට ද  නුහුරු නොවේ.

භාෂා අයිතිවාසිකම මූලික මානව හිමිකමක් හැටියට ලෝක මට්ටමින් පිළිගන්නා යුගයක අපි ජීවත් වෙමු. එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රශකානය ඒ පිළිබඳ වූ වැදගත් ම සම්මුතියේ ලිඛිත සාක්ෂිය යි.

එම සම්මුතියට එකඟ වූ රටවල් එහි කොන්දේසි ආරක්‍ෂා කිරීමට හා ප්‍රතිපත්තිමය වශයෙන් ක්‍රියාවට නැංවීමට බැඳී සිටී. ශ්‍රී ලංකාව විසින් ද පිළිගනු ලැබූ එක්සත් ජාතීන්ගේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර් ජාතික සම්මුතියට අනුව 'වර්ගය, වර්ණය, ස්ත්‍රී පුරුෂ භාවය, භාෂාව, ආගම හා දේශපාලන මතය යනාදී කවර භේදයක් හා ජාතික ආගමික සම්භවය, දේපළ, උපත යනාදී ස්වභාවයන් කෙරෙහි කිසිදු විශේෂයක් නොමැතිව සිය දේශ සීමාව ඇතුළත ද සිය අධිකරණ බල සීමාවට යටත්ව ද සියලුම පුද්ගලයන්ට මෙම අයිතිවාසිකම් උරුම වන බව වගබලා ගැනීම සඳහා සම්මුතියට ඇතුළත් රටවල් බැඳී සිටී.







# ව්‍යවස්ථාමය
## විධි විධාන

ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ද රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛන මගින් ද ශ්‍රී ලාංකීය රට වැසියාගේ භාෂා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම තහවුරු කර තිබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(2) ව්‍යවස්ථාවේ මෙසේ දැක්වේ.

''කිසි ම පුරවැසියෙකු වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භේදය දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන හේතු මත හෝ ඉන් කවර වූ හෝ හේතුවක් මත හෝ වෙනස්කමකට හෝ විශේෂයකට හෝ භාජනය නොවිය යුත්තේ ය.''

9 වැනි ව්‍යවස්ථාවට අනුව සිංහල හා දෙමළ භාෂා ශ්‍රී ලංකාවේ ජාතික භාෂා හැටියට පිළිගැනේ. සංශෝධිත 22(1) ව්‍යවස්ථාවට අනුව සිංහල හා දෙමළ භාෂා ශ්‍රී ලංකාව මුළුල්ලේ පරිපාලන භාෂා බවට පත් විය යුතු ය. එ මෙන් ම ඉගැන්වීමේ මාධ්‍යය, රජයේ ආයතනවල පොදු වාර්තා තබා ගැනීම ඇතුළු සියලු කටයුතු, ලිපි ගනු දෙනු උධෘත හෝ පරිවර්තන, පළාත් සභාවල සංදේශනය, බඳවා ගැනීමේ විභාග, අධිකරණ කටයුතු, යනාදී සියලු කාර්යයන්හි දී රටවැසියන්ගේ භාෂා අයිතිය ආරක්ෂා කිරීමේ විධිවිධාන ව්‍යවස්ථාවට ඇතුළත් කර ඇත.

භාෂා අයිතිවාසිකම් කඩවන අවස්ථාවන්හිදී සහන ලබා ගැනීමේ ආයතන ව්‍යුහයන් කිහිපයක්ම පවතී. එනම්,

- ශ්‍රේෂ්ඨාධිකරණය
- රාජ්‍ය භාෂා කොමිසම
- මහාධිකරණය
- මහේස්ත්‍රාත් අධිකරණය
- ඔම්බුඩ්ස්මන්
- මානව හිමිකම් කොමිසම් සභාව
- මහජන පෙත්සම් කාරක සභාව

කරුණු මෙසේ වුවද භාෂා අයිතිවාසිකම් අහිමි කරනු ලැබීමේ දිගු කාලීන ක්‍රියා දාමය ජනවාර්ගික යුද්ධයක් දක්වා දිග් ගැසී ගියේ ය.

යුද්ධය නිමාවීමෙන් අනතුරුව සම්පාදිත උගත්පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ නිර්දේශ (LLRC) අතර 'භාෂා ප්‍රතිපත්තිය' කෙරෙහි ද විශේෂ අවධානය යොමු කර ඇත. එම නිර්දේශ මාලාවේ 9.239 යටතේ මෙසේ සඳහන් වේ.

''සුළුතර ජාතිකයන් හට තම ව්‍යාපාරික ගනු දෙනු කරන්නට සිදු වී ඇත්තේ තමන්ගේ භාෂාවෙන් නොව අන්‍ය භාෂාවකිනි.

''භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රජා මට්ටමට වෙන් වූ සැලසුම් ද පුරවැසි සහභාගිත්වය ද තිබිය යුතු ය.'' (9.241)

''සන්නිවේදන නොහැකියාව නිසා දකුණේ ජනයාගෙන් උතුර හා නැගෙනහිර ජනයා වෙන් වී සිටී.'' (9.242)

''රජයේ සියලු කාර්යාලයන්හි දෙමළ කතා කරන නිලධරයන් සිටීම අනිවාර්ය කළ යුතු ය'' (9.247)

''රාජ්‍ය භාෂා කොමිසම කොළඹ පමණක් පිහිටුවා තිබීම නිසා ඈත ගම්බද පුරවැසියන් හට එහි පැමිණීම අසීරුය'' (9.248)

භාෂා අයිතිවාසිකම් කඩවීම නිසා ඇති වූ පීඩා සහ ප්‍රතිකර්ම පිළිබඳ LLRC වාර්තාව දැඩිව අවධානය යොමු කරනු පෙනේ.

රජයේ ආයතනවල ලිපි ලේඛන සහ පොදු උපදෙස් සකස් කිරීමේ දී සේවා ලාභීන්ගේ භාෂා අයිතියට ගරු කරමින් සිංහල සහ දෙමළ යන භාෂා දෙක ම පිළිබඳ සැලකිලිමත් වීම රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 03/2010 සහ 7/2007/1 මගින් තහවුරු කර ඇත.

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාලීන අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් 2010 නොවැම්බර් 22 අංක 1681/03 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යංශය පිහිටුවන ලදි.

රාජ්‍ය භාෂා දෙපාර්තුමේන්තුව, රාජ්‍ය භාෂා කොමිෂන් සභාව හා භාෂා අධ්‍යාපන පුහුණුව පිළිබඳ ජාතික ආයතනය යන ආයතන ත්‍රිත්වයෙහි කටයුතු මේ අමාත්‍යංශය යටතට පත් වේ.

භාෂා අයිතිවාසිකම් කඩවීම සම්බන්ධයෙන් දැනුවත් කිරීම, පුරවැසියන්ගේ දායකත්වයෙන් භාෂා සංගම් පිහිටුවීම, පැය විසිහතර පුරා ක්‍රියාත්මක වන 1956 අංකය අමතා තම පැමිණිලි ඉදිරිපත් කිරීමේ අවස්ථාව ලබා දීම යනාදී වැඩ කටයුතු අමාත්‍යංශයෙන් ආරම්භ කෙරිණි. එහෙත් කේන්ද්‍රයෙහි ඇති සංවාද කතිකාවත් පිළිබඳ සුබදායි දැක්ම පරිධියෙහි සිදුවන දේවලින් නිෂේධනය වන ආකාරය නිරීක්ෂණය කළ හැකි ය.









# භාෂා සංගම්වල ක්‍රියාකාරිත්වය

යහපාලනය හා රටවැසියාගේ අයිතිවාසිකම් විෂයයෙහි දිගු කලක් තිස්සේ ක්‍රියාත්මක වන සංවිධානයක් වශයෙන් අපි භාෂා අයිතිය වෙනුවෙන් පුමුඛ මට්ටමෙන් පෙනී සිටිමු. ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යංශය මගින් භාෂා සංගම් පිහිටුවීමේ ක්‍රියාවලියට සමාන්තරව යමින් අප විසින් භාෂා සංගම් පිහිටුවීම ආරම්භ කරන ලදි. හවුල්කාර සිවිල් සංවිධානවල මෙහෙයවීම යටතේ ග්‍රාමීය මට්ටමේ සිවිල් ක්‍රියාකාරිකයන්ගේ දායකත්වය ඇති ව මේවා පිහිටුවීම සිදුවිය. 2014 දෙසැම්බර් මාසය වචන විට දිස්ත්‍රික්ක 15 ක පිහිටුවන ලද භාෂා සංගම් ගණන 449 කි. එම සංගම්වලට අයත් සාමාජිකයන්ගේ ගණන 7962 කි.

## භාෂා සංගම් ක්‍රියාත්මක වන දිස්ත්‍රික්ක

අම්පාර, මඩකලපුව, මන්නාරම, ත්‍රිකුණාමලය, වව්නියාව, යාපනය, කොළඹ, නුවර එළිය, මහනුවර, මාතලේ, බදුල්ල, මොනරාගල, හම්බන්තොට, කිලිනොච්චි, කළුතර,

ව්‍යවස්ථාමය ප්‍රතිපාදන හා චක්‍රලේඛවල කෙසේ සඳහන් වුව ද තමන් වහරන බසින් තම අවශ්‍යතා ඉටුකරගැනීමේ අයිතිවාසිකම කඩවීමට ලක් වන රට වැසියන්ගේ දුක් ගැනවිලි භාෂා සංගම්වල නිරීක්ෂණයට හසු විය. එම සංගම් භාෂා ගැටලුව සම්බන්ධ අදාළ පැමිණිලි කෙළින් ම අදාළ ආයතන වලට යොමු කිරීම හෝ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ අවධානයට යොමු කිරීම මගින් භාෂා අයිතිවාසිකම් දිනා ගැනීමේ පුරවැසි මෙහෙවරට දායක වන්නට පටන් ගනු පෙනුණි.








# භාෂා සංගම් විසින් ඉදිරිපත් කරන ලද ලිපි (පැමිණිලි)

| | පරිපාලන අංශය | ත්‍රිකුණාමලය | මඩකලපුව | අම්පාර | වව්නියාව | යාපනය | මන්නාරම | කොළඹ | සම්පූර්ණ පැමිණිලි ගණන | ප්‍රතිචාර |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | ජනාධිපති ලේකම් කාර්යාලය | 285 | 300 | 300 | 258 | 300 | 300 | 45 | 1788 | 40 |
| 2 | භාෂා අමාත්‍යාංශය | 285 | 300 | 300 | 258 | 300 | 300 | 45 | 1788 | 40 |
| 3 | භාෂා දෙපාර්තමේන්තුව | 285 | 300 | 300 | 258 | 300 | 300 | 45 | 1788 | 38 |
| 4 | භාෂා කොමිසම | 285 | 300 | 300 | 258 | 300 | 300 | 45 | 1788 | 14 |
| 5 | ආණ්ඩුකාර වරයා | 285 | 300 | 300 | 258 | 300 | 300 | 45 | 1788 | 9 |
| 6 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 285 | 300 | 300 | 258 | 300 | 300 | 45 | 1788 | 60 |
| 7 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 255 | 300 | | | 300 | 300 | 45 | 1200 | 61 |
| 8 | පරිපාලන හා ස්වදේශීය කටයුතු අමාත්‍යාංශය | 30 | 300 | 300 | 258 | 300 | 300 | 45 | 1533 | 10 |
| 9 | තැපැල් සන්නිවේදනය | 30 | 30 | 30 | 20 | 30 | 7 | 6 | 153 | 8 |
| 10 | තැපැල් දෙපාර්තමේන්තුව | 30 | 30 | 30 | 20 | 30 | 7 | 6 | 153 | 11 |
| 11 | පළාත් තැපැල් අමාත්‍යාංශය | 30 | 30 | 30 | 20 | 30 | 7 | 6 | 153 | 3 |
| 12 | අධ්‍යාපන අමාත්‍යාංශය | 30 | 30 | 30 | 23 | 30 | 28 | 6 | 177 | 8 |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **13** | අධ්‍යාපන දෙපාර්ත මේන්තුව | 30 | 30 | 30 | 23 | 30 | 28 | 6 | 177 | 10 |
| **14** | පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ය | 30 | 30 | 30 | 23 | 30 | 28 | 6 | 177 | 9 |
| **15** | පළාත් අධ්‍යාපන දෙපාර්ත මේන්තුව | 30 | 30 | 30 | 23 | 30 | 28 | 6 | 177 | 12 |
| **16** | කලාප අධ්‍යාපන කාර්යාලය | 30 | 30 | 30 | 23 | 30 | 28 | 6 | 177 | 12 |
| **17** | කෘෂිකර්ම අමාත්‍යාංශ ය | 30 | 30 | 30 | 16 | 30 | 30 | 6 | 172 | 14 |
| **18** | කෘෂිකර්ම දෙපාර්ත මේන්තුව | 30 | 30 | 30 | 16 | 30 | 30 | 6 | 172 | 21 |
| **19** | පළාත් කෘෂිකර්ම දෙපාර්ත් මේන්තුව | 30 | 30 | 30 | 16 | 30 | 30 | 6 | 172 | 10 |
| **20** | ධීවර සමුපකාර සමිතිය | 30 | 30 | 30 | 15 | 30 | 19 | 6 | 160 | 15 |
| **21** | ධීවර අමාත්‍යාංශ ය | 30 | 30 | 30 | 15 | 30 | 19 | 6 | 160 | 13 |
| **22** | ධීවර දෙපාර්ත මේන්තුව | 30 | 30 | 30 | 15 | 30 | 19 | 6 | 160 | 13 |
| **23** | පළාත් ධීවර අමාත්‍යාංශ ය | 30 | 30 | 30 | 15 | 30 | 19 | 6 | 160 | 10 |
| **24** | දිවි නැගුම කොමසාරි ස් | 30 | 30 | 30 | 21 | 30 | 30 | 6 | 177 | 14 |
| **25** | සෞඛ්‍ය දෙපාර්ත මේන්තුව | 30 | 30 | 30 | 21 | 30 | 30 | 6 | 177 | 10 |
| **26** | සෞඛ්‍ය අමාත්‍යාංශ ය | 30 | 30 | 30 | 21 | 30 | 30 | 6 | 177 | 11 |
| **27** | පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ ය | 30 | 30 | 30 | 21 | 30 | 30 | 6 | 177 | 12 |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **28** | කලාප සෞඛ්‍ය අධ්‍යක්ෂක | 30 | 30 | 30 | 21 | 150 | 30 | 6 | 297 | 11 |
| **29** | සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී | 30 | 30 | 30 | 21 | 30 | 30 | 6 | 177 | 14 |
| **30** | සමෘද්ධි කොමසාරිස් | 30 | 30 | 30 | 30 | 30 | 30 | 6 | 186 | 18 |
| **31** | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | | | 45 | 30 | | | | 75 | 3 |

## භාෂා සංගම් විසින් ඒඒ දිස්ත්‍රික්කයන්ගෙන් ඉදිරිපත් කරන ලද ලිපි (පැමිණිලි)



## භාෂා සංගම් විසින් ඉදිරිපත් කරන ලද ලිපි (පැමිණිලි) හා ඊට ලැබුණු ප්‍රතිචාර



## භාෂා සංගම් විසින් දිරිපත් කරන ලද ලිපි (පැමිණිලි) හා ඊට ලැබුණු ප්‍රතිචාර සම්බන්ධව සමස්ත ප්‍රතිශතය











# භාෂා අයිතිවාසිකම්

## කඩවීම සම්බන්ධව ශ්‍රී ලංකා රාජ්‍ය භාෂා කොමිෂන් සභාවට හා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම වෙත විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ඉදිරිපත් කළ පැමිණිලි

ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ භාෂා අයිතිවාසිකම් උල්ලංඝනය වීමට එරෙහිව වගකිව යුතු රාජ්‍ය ආයතනයන් දැනුවත් කරමින් පුරවැසියන්ගේ භාෂා අයිතිය සුරකිමින්, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය විධිමත්ව ක්‍රියාවේ යෙදවීම අපගේ අරමුණයි. 2011 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ භාෂා අයිතිවාසිකම් කඩ වූ අවස්ථාවන් පදනම් කර ගනිමින් ඒ පිළිබදව වගකීමක් ඇති රාජ්‍ය ආයතන ලෙස ශ්‍රී ලංකා රාජ්‍ය භාෂා කොමිෂන් සභාවට හා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට විටින් විට ඉදිරිපත් කළ පැමිණිලි සංඛ්‍යාව 300කට අධික වේ.

## හැඳින්වීම

මෙම වාර්තාව හරහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ භාෂා අයිතිවාසිකම් උල්ලංඝනය වීම් පිළිබඳව අප විසින් ශ්‍රී ලංකා රාජ්‍ය භාෂා කොමිෂන් සභාවට හා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට ඉදිරිපත් කළ පැමිණිලි පිළිබඳවත්, එම පැමිණිලි සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය භාෂා කොමිෂන් සභාව හා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මේ වන විට ගෙන ඇති පියවරයන් පිළිබඳව දැනුවත් කිරීමද අපේක්ෂිතය.

## සන්දර්භය

රාජ්‍ය අංශය තුළ හා පෞද්ගලික අංශය හරහා භාෂා අයිතිය උල්ලංඝනය වීම සම්බන්ධයෙන් අදියර 01, 02, 03 හා 04 යන අවස්ථාවලදී ශ්‍රී ලංකා රාජ්‍ය භාෂා කොමිෂන් සභාවට හා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට අදාළ උල්ලංඝනයන් සම්බන්ධව ඊට නිදර්ශනික සාක්ෂි සමගින් පැමිණිලි රාශියක් යොමු කරන ලදි. පහත දැක්වෙන්නේ ඒ ඒ අදියරයන්හී දී ශ්‍රී ලංකා රාජ්‍ය භාෂා කොමිෂන් සභාවට හා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මගින් ගොනු කරන ලද පැමිණිලි සංඛ්‍යාවයි.

| අදියර | පැමිණිලි සංඛ්‍යාව | | එකතුව |
|---|---|---|---|
| | රාජ්‍ය අංශය | පෞද්ගලික අංශය | |
| 01 අදියර | 26 | - | 26 |
| 02 අදියර | 12 | 95 | 107 |
| 03 අදියර | 93 | 14 | 107 |
| 04 අදියර | 48 | 27 | 75 (2014/11/12 වන දිනට) |

මේ අනුව රාජ්‍ය හා පෞද්ගලික අංශයන් තුළදී භාෂා අයිතිය කඩ වීම සම්බධන්ව 2014/11/12 වන දින වන විට පැමිණිලි 315 ක් ශ්‍රී ලංකා රාජ්‍ය භාෂා කොමිෂන් සභාව හා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමු කර තිබේ. ඒ අනුව සමස්තයක් වශයෙන් කොමිෂන් සභා ද්විත්වයටම පැමිණිලි 630 ක් ඉදිරිපත් කර ඇත.

පහතින් දැක්වෙනුයේ මෙම පැමිණිලි සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය භාෂා කොමිෂන් සභාව හා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ගන්නා ලද පියවරයන් සම්බන්ධව සංඛ්‍යා දත්තයන් ය.

| අදියර | පැමිණිලි සංඛ්‍යාව | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රාජ්‍ය අංශය | ගනු ලැබූ පියවර ගණන | | පියවරයන් ගෙන නොමැති ගණන | | පෞද්ගලික අංශය | ගනු ලැබූ පියවර ගණන | | පියවරයන් ගෙන නොමැති ගණන | |
| | | රා.භා. කො. | මා.හි. කො. | රා.භා. කො. | මා.හි. කො | | රා.භා. කො. | මා.හි. කො | රා.භා. කො. | මා.හි.කො |
| 01 අදියර | 26 | 20 | 22 | 06 | 04 | - | - - | 2014/12/12 වන දිනට දෙපාර්ශවයම කැඳවා සාකච්ඡා කිරීමට නියමිතය | - | 2014/12/12 වන දිනට දෙපාර්ශවයම කැඳවා සාකච්ඡා කිරීමට නියමිතය |
| 02 අදියර | 12 | - | 08 | 12 | 04 | 95 | - | | 95 | |
| 03 අදියර | 93 | 57 | 54 | 36 | 39 | 14 | - | | 14 | |
| 04 අදියර | 48 | - | 30 | 48 | 18 | 27 | - | | 27 | |
| එකතුව | 179 | 77 | 114 | 102 | 65 | 136 | - | | 136 | |

මා.හි.කො. - මානව හිමිකම් කොමිසම

රා.භා.කො. - රාජ්‍ය භාෂා කොමිසම



**රාජ්‍ය අංශය තුළ භාෂා අයිතිය කඩ වීම සම්බන්ධව ශ්‍රී ලංකා රාජ්‍ය භාෂා කොමිෂන් සභාවට හා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමට ඉදිරිපත් කළ පැමිණිලි හා ඒ සම්බන්ධව ශ්‍රී ලංකා රාජ්‍ය භාෂා කොමිෂන් සභාව හා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට ගත් පියවරයන් පිළිබඳ දත්ත**



**පාරිභෝගිකයන්ගේ භාෂා අයිතිවාසිකම් කඩවීම පිළිබඳව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට ශ්‍රී ලංකා රාජ්‍ය භාෂා කොමිෂන් සභාව හා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම මගින් ඉදිරිපත් කළ පැමිණිලි සම්බන්ධව රාජ්‍ය භාෂා කොමිෂන් සභාව හා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම ගත් පියවර පිළිබඳ දත්ත**




රාජ්‍ය භාෂා කොමිසම හා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව අදාළ පැමිණිලි සම්බන්ධව පියවර ගත් හා නොගත් ප්‍රමාණයේ ප්‍රතිශතය
04 අදියර
03 අදියර
02 අදියර
01 අදියර
මා.හි.කො.
රා.භා.කො.
0%
10%
20%
30%
40%
50%
60%
70%
80%
90%
100%
ගනු ලැබූ පියවර ගණනේ ප්‍රතිශතය
පියවරයන් ගෙන නොමැති ගණනේ ප්‍රතිශතය

භාෂා අයිතිවාසිකම් උල්ලංඝනය වීම සම්බන්ධව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමට හා රාජ්‍ය භාෂා කොමිසමට පොදුවේ පැමිණිලි ඉදිරිපත් කරන අතර එම පැමිණිලි සදහා රාජ්‍ය භාෂා කොමිසම හා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම මේ වන විට ගනු ලැබූ පියවර සම්බන්ධ දත්ත වෙන් වෙන් වශයෙන් මෙසේ දැක්විය හැකිය.

ඉදිරිපත් කළ සමස්ත පැමිණිලි 315 අතුරින් රාජ්‍ය භාෂා කොමිසම ඒ සම්බන්ධව පියවර 77 ක් ගෙන ඇති අතර ඉන් පියවර 20 ක් තනි වශයෙන් ගෙන ඇත. ඉතිරි පියවර 57 ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම හා සමගාමීව ගෙන ඇත.




එසේම ඉදිරිපත් කළ සමස්ත පැමිණිලි 315 අතුරින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පියවර 114ක් ගෙන ඇති අතර ඉන් පියවර 57ක් තනි වශයෙන් ගෙන ඇත. ඉතිරි පියවර 57 රාජ්‍ය භාෂා කොමිසම හා සමගාමීව ගෙන ඇත.



## රටවැසියාගේ දුක් ගැනවිලි

1. රාජ්‍ය ආයතනවලින් ලැබෙන ලියුම් තමන් නොදන්නා බසකින් සකස් කර තිබීම.
2. රාජ්‍ය ආයතනයකට ගිය විට තමන්ගේ භාෂාවෙන් ඇමතිය හැකි නිලධාරියෙකු එහි නොසිටීම.
3. රාජ්‍ය ආයතන හා පොදු ස්ථානවල, දුම්රිය හා බස් රියවල නාමපුවරු තනි භාෂාවකින් පමණක් සකස් කර තිබීම.
4. වෙළඳ භාණ්ඩවල ඇසුරුම් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් මුද්‍රණය කර තිබීම.
5. තරග විභාග, සාමාන්‍ය විභාග සහ සම්මුඛ පරීක්ෂ පිළිබඳ කෙරෙන දැනුම් දීම් නොදන්නා භාෂාවකින් මුද්‍රණය කර තිබීම.
6. ග්‍රාම නිලධාරී ඇතුළු සමහර රාජ්‍ය නිලධාරීන් තමන්ට අයත් බල ප්‍රදේශයෙහි ජනතාව වහරන බස නොදැන සිටීම.
7. වෙනත් ගැටලු

මෙ බඳු ගැටලු වලදී ගත යුතු ක්‍රියාමාර්ග කවරේදැයි පැහැදිලි කරදීම සිදු වූයේ භාෂා සංගම්වල සහභාගිත්වයෙනි. රාජ්‍ය හා පුද්ගල අංශය ඉලක්ක කර ගනිමින් මෙ බඳු දැනුවත් කිරීමේ වැඩ සටහන් දියත් කිරීම පලදායක විය.

භාෂා සංගම්වල මැදිහත්වීමෙන් රාජ්‍ය අංශයේ, පුද්ගලික අංශයේ සහ පොදු ස්ථානවල කරන ලද වෙනස්කම් මෙහිදී කැපී පෙනේ.

උදා: පොදු ස්ථාන හා රාජ්‍ය ආයතනවල නාම පුවරු ත්‍රෛභාෂාවෙන් සකස් කිරීම

**2014 දෙසැම්බර් මස වන විට රාජ්‍ය ආයතනවල වෙනස්කම් 1920ක් ද පොදු ස්ථානවල වෙනස්කම් 2550 ක් ද කරන්නට හැකිවීම සාධනීය මට්ටමකි. ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යංශය පුරවැසියන්ගේ භාෂා පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා හඳුන්වා දුන් 1956 හදිසි අංකය ඇතුළත් පුවරුව විවිධ පළාත්වල ස්ථාපිත කිරීම සඳහා මැදිහත්වීම ද විශේෂ සිදුවීමකි.**

භාෂා අයිතීන් කඩවීම සම්බන්ධයෙන් අවශ්‍ය අවස්ථාවන්හිදී නීතිමය පියවර ගැනීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කටයුතු කළේ ය. මේ එයින් කිහිපයකි.










# අධිකරණ හා කොමිෂන් සභා තීන්දු

## විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට එරෙහිව

කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනය *(IHRA)* විසින් පවත්වනු ලබන පාඨමාලා රැසක් සිංහල මාධ්‍යයට පමණක් සීමා වී පවතී. මෙයින් දෙමළ සිසුන්ට සිදුවන අසාධාරණය සලකා බලා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ගයක් ගැනීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කටයුතු කළේ ය.

## මුදල් නෝට්ටුවෙන් දෙමළ බස ගිලිහීම

ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නිකුත් කරනු ලබන මුදල් නෝට්ටුවල ඇතුළත් තොරතුරු සිංහල භාෂාවෙන් පමණක් තිබීමට එරෙහිව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිල්ලක් ඉදිරිපත් කළේ ය.

මේ සම්බන්ධයෙන් පැවති විභාගයේ දී මහ බැංකුව තම වැරදි පිළිගත්තේ ය. නැවත මුදල් නෝට්ටු මුද්‍රණය කෙරෙන විට එම තොරතුරු භාෂා තුනෙන් ම සඳහන් කිරීමට බැංකුව එකඟ විය. මේ පැමිණිල්ල විභාග කරන ලද්දේ 2014 ජූලි මස 16 දා ය.



## ආහාර නිෂ්පාදන ඇසුරුම්

වෙළඳ පොළෙහි අළෙවි කෙරෙන ආහාර ද්‍රව්‍ය ඇතුළු නිෂ්පාදන බොහොමයක ඇසුරුම් හා දවටනවල සඳහන් විය යුතු තොරතුරු ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සඳහන් වීම නිසා දෙමළ හා සිංහල ජනතාවගෙන් බහුතරයකගේ අයිතිවාසිකම් කඩ වී ඇත.

තමා මිළ දී ගන්නා භාණ්ඩයේ ප්‍රමිතිය, සංයුතිය හා බලපෑම සම්බන්ධයෙන් අවබෝධයක් නොතිබීම ඔවුන්ට හානිකර තත්ත්වයකි. මේ සම්බන්ධයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පාරිභෝගික සේවා අධිකාරියට පැමිණිල්ලක් ඉදිරිපත් කළේ ය. දේශීය වෙළඳ පොළෙහි ඇති නිෂ්පාදන ද්‍රව්‍යයන්හි ගැටලු සම්බන්ධයෙන් පාරිභෝගික ආරක්ෂණ අධිකාරියට පැමිණිලි කිරීමේ හැකියාවක් ඇත. මෙහි ශාඛා සෑම දිස්ත්‍රික්කයක ම පිහිටුවා තිබේ.

## ඖෂධ ලේබල් සඳහා භාෂා තුන ම අනිවාර්ය කිරීම




2012.06.08 වැනි දින විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය *HRC/2249/12* යටතේ මානව හිමිකම් කොමිසමට පැමිණිල්ලක් ඉදිරිපත් කළේ ය. වෙළෙඳ පොළෙහි අලෙවි කෙරෙන ඖෂධ ඇසුරුම්වල ඇතුළත් තොරතුරු ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් මුද්‍රණය කර තිබීමෙන් සිදුවන අසාධාරණය පැමිණිල්ලේ නිමිත්ත විය.

2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක කරන ලෙස නියෝග කරමින් මෙහි තීන්දුව ලැබිණි. ඒ අනුව ඖෂධ, වෛද්‍ය උපකරණ, රූපලාවන්‍ය භාණ්ඩ හා ආලේපනවල ඇසුරුම් සඳහා ඖෂධ නියාමන අධිකාරියෙන් අවසරය ලබාගැනීම අනිවාර්ය කෙරේ. මානව හිමිකම් කොමිෂන් සභාවේ උපදෙස් අනුව ඇසුරුම් කවරවල සිංහල, දෙමළ, සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන් ම තොරතුරු ඇතුළත් කෙරෙන බව සඳහන් කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය තාක්ෂණ සහ සැපයීම් අංශයේ අධ්‍යක්ෂ වෛද්‍ය බී.බී.එස් එම්.බෙනරගම නිවේදනයක් නිකුත් කළේ ය.

## ජාතික හැඳුනුම් පත භාෂා දෙකෙන් ම

ජාතික හැඳුනුම් පත සිංහල සහ දෙමළ යන භාෂා දෙකෙන් ම නිකුත් කරන මෙන් ඉල්ලමින් මහරගම අනුරාධ ප්‍රදීප් ධනංජය ගුරුගේ සිසුවා ශ්‍රේෂ්ඨාධිකරණයට පැමිණිල්ලක් ගොනු කළේ 2013 ඔක්තෝබර් මස දී ය. අගවිනිසුරු ඉදිරියේ විභාග යට ගැනුණු මේ පෙත්සමේ වග උත්තරකරුවන් ලෙස නම් කර තිබුණේ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්, ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා ඇමතිවරයා, ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම් සහ නීතිපති ය.

*STER 93 OF 2013* දරන මේ පෙත්සම විභාග කිරීමෙන් අනතුරු ව ජාතික හැඳුනුම් පත භාෂා තුනෙන් ම නිකුත් කළ යුතු බවටත් වසර 3 ක් ඇතුළත එය ඉෂ්ට කළ යුතු බවටත් ශ්‍රේෂ්ඨාධිකරණය පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවට නියෝග කළේ ය.

එමෙන් ම 2014 ජනවාරි 01 දා සිට නිකුත් කරන සියලුම ජාතික හැඳුනුම් පත් සිංහල හා දෙමළ යන භාෂා දෙකෙන් සකස් විය යුතු බව ද ශ්‍රේෂ්ඨාධිකරණය දැනුම් දුන්නේ ය.

එහෙත් ජනවාරි 01 දා වන විට එම නියෝගය ක්‍රියාත්මක කිරීම පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව අසමත් විය.

## බස් රථවල නාම පුවරු සහ දුම්රිය නිවේදන ඒක භාෂීය වීම




බස් රථවල නාම පුවරු තමන් දන්නා භාෂාවෙන් සඳහන් නොකර තිබීම නිසා මගී ජනතාව දුෂ්කරතාවන්ට ලක්වන අවස්ථා බහුල ය. දෙමළ ජනතාව ජීවත්වන ප්‍රදේශයක එම නාම පුවරු සිංහලෙන් පමණක් සකස් ව තිබීම නිසා මගීන් මුහුණ දෙන පීඩාකාරී තත්ත්වය අමුතුවෙන් විස්තර කළ යුතු නොවේ. දුම්රිය පොළවල්හි නිවේදන කටයුතු සිංහලෙන් පමණක් සිදු කිරීම ඉනිසා මගීන් මුහුණ දෙන්නේ ද එ බඳු ගැටලුවකට ය.

උදාහරණයක් වශයෙන් ගත් විට බදුල්ල දුම්රිය මධ්‍යස්ථානයෙහි නිවේදන කටයුතු සිංහලෙන් පමණක් සිදු කෙරේ. මේ පිළිබඳව කළ විමසා බැලීමේ දී අනාවරණය වුණු කරුණු මෙහි දැක් වේ.

දුම්රිය කාල සටහන් දින දෙක තුනකට වරක් වෙනස් වන නිසා නිවේදන භාෂා දෙකින් ම සකස් කිරීමට වෙහෙස වීමේ අරුතක් නැතැයි දුම්රිය ස්ථානාධිපතිවරයා පවසයි. භාෂා දෙකින් නිවේදනය කිරීමේ හැකියාවක් ඇති අය එම දුම්රිය ස්ථානයෙහි සේවය නොකරති. එහි කාර්ය මණ්ඩලය අවශ්‍යතාව 20ක් වන නමුත් දැනට එහි සේවය කරන සංඛ්‍යාව අටකි.

එහෙත් බදුල්ල යනු සැලකිය යුතු දෙමළ ජන සංයුතියක් ඇති ප්‍රදේශයකි. එමෙන් ම සංචාරකයෝද එහි බහුලව පැමිණෙති. එනිසා සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යවන භාෂාවලින් නිවේදන කටයුතු කිරීම අත්‍යාවශ්‍ය ය. මානව හා භෞතික සම්පත් හිඟකම එහි දී ගැටලුවක් ව පවතී.

බස් රථවල නාම පුවරු ත්‍රෛභාෂාවෙන් සකස් නොකිරීම පිළිබඳ සලකා බලන විට පෙනෙනුයේ නොසැලකිල්ලේ තරම ය. ග්‍රාම නාම දෙමළෙන් සඳහන් කිරීමේ දී දෝෂ ද කැපී පෙනේ.

බස් රථවල නාම පුවරු හා දුම්රිය නිවේදන කටයුතු සම්බන්ධයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ජාතික මට්ටමෙන් කළ සමීක්ෂණයක දී පෙනී ගියේ ද්විභාෂීය නාම පුවරු සකස් කිරීම අතින් පුද්ගලික බස් රථ සේවාව ලංගම බස්රථ සේවාවට වඩා ඉදිරියෙන් තිබෙන බව ය. ලංගම බස්රථවල ද්විභාෂීය නාම පුවරු සකස් කිරීමේ ප්‍රතිශතය 72% ක් වන විට පුද්ගලික බස් රථවල හම ප්‍රතිශතය 99% කි. ලංගම බස් රථවල ඒකභාෂීය නාම පුවරුවල ප්‍රතිශතය 28% ක් වන විට පුද්ගලික බස් රථවල එම අගය 11% කි.




දුම්රිය නැවතුම් පළවල නිවේදන කටයුතුවල භෂාව පිළිබඳව කරන ලද සමීක්ෂණයේ දී අනාවරණය වී ඇති තොරතුරු මෙපරිදි ය.

සාමාන්‍ය නිවේදන භාෂා දෙකින්ම ඉදිරිපත් කිරීමේ ප්‍රතිශතය 11% කි. ඒක භාෂීය නිවේදන ප්‍රතිශතය 89% කි. විශේෂ නිවේදන ඉදිරිපත් කිරීමේ දී ද්විභාෂීයව ඉදිරිපත් කිරීමේ ප්‍රතිශතය 01% කි.ඒක භාෂීයව ඉදිරිපත් කිරීමේ ප්‍රතිශතය 99% කි. මෙය ඉතා කණගාටුදායක තත්ත්වයකි. මන්ද මගී හා භාණ්ඩ ප්‍රවාහන විෂයෙහි දී දුම්රිය උතුරු නැගෙනහිර හා මධ්‍යම පළාත් සමඟ අගනුවරට කෙලින් ම සම්බන්ධ වන නිසා ය. එමෙන් ම සංචාරකයන් ප්‍රවාහනය සලසා ගන්නා මගක් ද වී ඇති නිසා ය.







විවිධ ප්‍රදේශවල ඒකභාෂික නාම පුවරු දක්නට ලැබුණු අයුරු....





# ශ්‍රී ලංගම බස් රථ, පෞද්ගලික බස් රථ හා දුම්රිය නිවේදන ආදියෙහි ද්වී භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීම පිළිබඳව සකස් කරන ලද සමීක්ෂණ වාර්තාව

## හැදින්වීම

ලංකාවේ සුළුතර ජාතිකත්ව ප්‍රජාවන් හි භාෂා අයිතිය ප්‍රවර්ධනය කිරීමේ සිව්වන අදියර මේ වන විට ක්‍රියාත්මක කරනු ලැබේ. පුරවැසියන්ගේ භාෂා අයිතිය උල්ලංඝනය වීම සම්බන්ධයෙන් අප විසින් වරින් වර ශ්‍රී ලංකා රාජ්‍ය භාෂා කොමිෂන් සභාවට හා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිලි රැසක් ඉදිරිපත් කර ඇත. 2012/09/01 දින *OLC/C/2012/W/1/4, 5* හා *HRC/281/12, HRC/282/12* දරණ පැමිණිලි ඔස්සේ ශ්‍රී ලංගම හා පෞද්ගලික බස් රථවල නාම පුවරු ත්‍රෛභාෂාවෙන් ප්‍රදර්ශනය නොකිරීම පිළිබඳව ශ්‍රී ලංකා රාජ්‍ය භාෂා කොමිෂන් සභාවට හා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිලි කර ඇත. එසේම දිවයිනේ ප්‍රධාන දුම්රිය නැවතුම් පොළවල් හි නිවේදන කටයුතු ත්‍රෛභාෂාවෙන්ම සිදු නොවීම පිළිබඳව

2011/08/11 වන දින *OLC/C/188* හා *HRC/3463,3464,3465,3466/11* දරණ පැමිණිලි ඔස්සේ ශ්‍රී ලංකා රාජ්‍ය භාෂා කොමිෂන් සභාවට හා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිලි කර ඇත. එහිදී උක්ත පැමිණිලි වලට විසඳුමක් ලැබුණු අතර ඒවා නිවැරදිව ක්‍රියාත්මක වන්නේද යන්න නිරීක්ෂණය කරනු පිණිස දිවයින පුරා මෙම සමීක්ෂණය දියත් කර තිබේ.

## පර්යේෂණ විධික්‍රමය

ශ්‍රී ලාංකාවේ සියලුම පළාත් හා දිස්ත්‍රික් ආවරණය වන පරිදි මෙම සමීක්ෂණය සිදු කරනු ලැබූ අතර 2014/07/30 දින දිවයිනේ සියලුම ප්‍රදේශයන් හි බස් රථ සමීක්ෂණය දියත් කෙරිණි. එහිදී ශ්‍රී ලංගම බස් රථ හා පෞද්ගලික බස් රථ සමීක්ෂණය සඳහා යොදා ගනු ලැබූ අතර පෞද්ගලික බස් රථ පළාත් තුළ හා අන්තර් පළාත් වශයෙන් කොටස් දෙකකට බෙදා වෙන් කරන ලදි. එසේම දිවයිනේ සියලුම පළාත් නියෝජනය වන පරිදි 2014/07/11 වන දින දුම්රිය ස්ථාන 32 ක අදාළ නිරීක්ෂණ කටයුතු සිදු කරනු ලැබීය.

මෙම සමීක්ෂණයේ තොරතුරු වෙන් වෙන්ව සවිස්තරව ඒ ඒ අනු මාතෘකා යටතේ පහත පරිදි දැක්වේ.









# සමස්ත ලංකා ශ්‍රී ලංගම බස් රථයන්හි ද්වි භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මකවීම

## දත්ත විශ්ලේෂණය

| උතුරු පළාත | | | | |
|---|---|---|---|---|
| මුළු බස් රථ ගණන | ද්වී භාෂික බස් රථ ගණන | ඒක භාෂික (දෙමළ) බස් රථ ගණන | ද්වී භාෂික ප්‍රතිශතය | ඒක භාෂික (දෙමළ) ප්‍රතිශතය |
| 419 | 366 | 53 | 87% | 13% |




| උතුරු මැද පළාත | | | | |
|---|---|---|---|---|
| මුළු බස් රථ ගණන | ද්වී භාෂික බස් රථ ගණන | ඒක භාෂික (සිංහල) බස් රථ ගණන | ද්වී භාෂික ප්‍රතිශතය | ඒක භාෂික (සිංහල) ප්‍රතිශතය |
| 84 | 38 | 46 | 45% | 55% |



| නැගෙනහිර පළාත | | | | |
|---|---|---|---|---|
| මුළු බස් රථ ගණන | ද්වි භාෂික බස් රථ ගණන | ඒක භාෂික (දෙමළ) බස් රථ ගණන | ද්වි භාෂික ප්‍රතිශතය | ඒක භාෂික (දෙමළ) ප්‍රතිශතය |
| 181 | 173 | 08 | 96% | 4% |




| වයඹ පළාත | | | | |
|---|---|---|---|---|
| මුළු බස් රථ ගණන | ද්වි භාෂික බස් රථ ගණන | ඒක භාෂික (සිංහල) බස් රථ ගණන | ද්වි භාෂික ප්‍රතිශතය | ඒක භාෂික (සිංහල) ප්‍රතිශතය |
| 176 | 106 | 70 | 60% | 40% |



| ඌව පළාත | | | | |
|---|---|---|---|---|
| මුළු බස් රථ ගණන | ද්වි භාෂික බස් රථ ගණන | ඒක භාෂික (සිංහල) බස් රථ ගණන | ද්වි භාෂික ප්‍රතිශතය | ඒක භාෂික (සිංහල) ප්‍රතිශතය |
| 317 | 209 | 108 | 66% | 34% |




| මධ්‍යම පළාත | | | | |
|---|---|---|---|---|
| මුළු බස් රථ ගණන | ද්වි භාෂික බස් රථ ගණන | ඒක භාෂික (සිංහල) බස් රථ ගණන | ද්වි භාෂික ප්‍රතිශතය | ඒක භාෂික (සිංහල) ප්‍රතිශතය |
| 489 | 350 | 139 | 72% | 28% |



| සබරගමුව පළාත | | | | |
|---|---|---|---|---|
| මුළු බස් රථ ගණන | ද්වි භාෂික බස් රථ ගණන | ඒක භාෂික (සිංහල) බස් රථ ගණන | ද්වි භාෂික ප්‍රතිශතය | ඒක භාෂික (සිංහල) ප්‍රතිශතය |
| 252 | 186 | 66 | 74% | 26% |




| බස්නාහිර පළාත | | | | |
|---|---|---|---|---|
| මුළු බස් රථ ගණන | ද්වි භාෂික බස් රථ ගණන | ඒක භාෂික (සිංහල) බස් රථ ගණන | ද්වි භාෂික ප්‍රතිශතය | ඒක භාෂික (සිංහල) ප්‍රතිශතය |
| 305 | 205 | 100 | 67% | 33% |



| දකුණු පළාත | | | | |
|---|---|---|---|---|
| මුළු බස් රථ ගණන | ද්වි භාෂික බස් රථ ගණන | ඒක භාෂික (සිංහල) බස් රථ ගණන | ද්වි භාෂික ප්‍රතිශතය | ඒක භාෂික (සිංහල) ප්‍රතිශතය |
| 248 | 146 | 102 | 59% | 41% |




සමස්තයක් ලෙස සමීක්ෂණයට බඳුන් කළ පළාත් නවයෙහිම ශ්‍රී ලංගම බස් රථ ගණන 2471 ක් වේ. ඉන් ද්වි භාෂික නාම පුවරු සහිත බස් රථ ගණන 1779 ක් ද ඒක භාෂික (සිංහල හෝ දෙමළ) නාම පුවරු සහිත බස් රථ ගණන 692 ක් ද වශයෙන්ද හඳුනා ගන්නා ලදි. මෙය ප්‍රතිශතයක් ලෙස පහත පරිදි දැක්විය හැකිය.






ඒ ඒ පළාත් හි ශ්‍රී ලංගම බස් රථවල ද්වි භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වී තිබූ අයුරු ප්‍රතිශතයක් ලෙස දැක්වීමේදී නැගෙනහිර පළාත පමණක් 90% කට වැඩි ප්‍රමාණයක් වාර්තා කර තිබුණි. උතුර, මධ්‍යම හා සබරගමුව යන පළාත් වල 70% කට වැඩි ප්‍රමාණයක ද්වි භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වනු දක්නට ලැබුණු අතර වයඹ, ඌව, දකුණ සහ බස්නාහිර යන පළාත් හි දක්නට ලැබුණේ 50% කට වැඩි ප්‍රතිශතයකි. ද්වි භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීමේ අවම ප්‍රතිශතයක් දක්නට ලැබුණේ උතුරු මැද පළාතෙහි වන අතර එය 45% ක් තරම් ප්‍රමාණයකි.

## ශ්‍රී ලංකාවේ ප්‍රධාන බස් නැවතුම් පොළවල් හි දත්ත විශ්ලේෂණය

දිවයින පුරා තෝරා ගත් ප්‍රධාන බස් නැවතුම් පොළවල් 15 ක ද්වි භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වේ දැයි සමීක්ෂණය කළ අතර එහි නිරීක්ෂණ පහත පරිදි දැක්විය හැකිය.

| ප්‍රධාන බස් නැවතුම් පොළ | සමීක්ෂණයට ලක් කළ මුළු බස් රථ ගණන | ද්වි භාෂික නාම පුවරු සහිත බස් රථ ගණන | ඒක භාෂික (සිංහල හෝ දෙමළ) නාම පුවරු සහිත බස් රථ ගණන |
|---|---|---|---|
| රත්නපුර | 106 | 70 | 36 |
| මඩකලපුව | 30 | 30 | 00 |
| ත්‍රිකුණාමලය | 37 | 37 | 00 |
| කුරුණෑගල | 131 | 84 | 47 |
| වව්නියාව | 200 | 148 | 52 |
| අම්පාර | 74 | 66 | 08 |
| මොණරාගල | 69 | 44 | 25 |
| නුවර එළිය | 37 | 35 | 02 |
| මාතර | 40 | 04 | 36 |
| බදුල්ල | 95 | 78 | 17 |
| ගාල්ල | 59 | 40 | 19 |
| කොළඹ කොටුව | 202 | 133 | 69 |
| ගම්පහ | 25 | 16 | 09 |
| කිලිනොච්චිය | 43 | 43 | 00 |
| යාපනය | 19 | 18 | 01 |

## ප්‍රධාන බස් නැවතුම්පොළවල් - ශ්‍රී ලංගම




ප්‍රධාන බස් නැවතුම් පොළවල් හි ශ්‍රී ලංගම බස් රථ සමීක්ෂණය කිරීමෙන් අනතුරුව පැහැදිලි වූ කරුණු කීපයක් සැකෙවින් දැක්විය හැකිය. මෙහිදී ද්වී භාෂා ප්‍රතිපත්තිය ප්‍රතිශතයක් ලෙස ගත් කල මඩකලපුව, ත්‍රිකුණාමලය හා කිලිනොච්චිය යන බස් නැවතුම් පොළවල් හි 100% ක්ම ක්‍රියාත්මක වන අයුරු දක්නට ලැබුණි. රත්නපුර, කුරුණෑගල, වව්නියාව, අම්පාර, මොණරාගල, නුවර එළිය, බදුල්ල, ගාල්ල, කොළඹ කොටුව, ගම්පහ හා යාපනය යන බස් නැවතුම් පොළවල් හි ද්වී භාෂා ප්‍රතිපත්තිය 50% කට වැඩි ප්‍රමාණයක් ක්‍රියාත්මක වන අයුරු දැකිය හැකි වූ අතර මාතර බස් නැවතුම් පොළෙහි පමණක් ද්වී භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වී තිබුණේ 10% ක් තරම් අවම ප්‍රමණයකි.

## සමස්ත ලංකා ශ්‍රී ලංගම බස් රථ ප්‍රමාණය සවිස්තරාත්මකව



## සමස්ත ලංකා පෞද්ගලික බස් රථයන්හි ද්වි භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීම දත්ත විශ්ලේෂණය

| උතුරු පළාත | | | | |
|---|---|---|---|---|
| මුළු බස් රථ ගණන | ද්වි භාෂික බස් රථ ගණන | ඒක භාෂික (දෙමළ) බස් රථ ගණන | ද්වි භාෂික ප්‍රතිශතය | ඒක භාෂික (දෙමළ) ප්‍රතිශතය |
| 626 | 528 | 98 | 84% | 16% |




| උතුරු මැද පළාත | | | | |
|---|---|---|---|---|
| මුළු බස් රථ ගණන | ද්වි භාෂික බස් රථ ගණන | ඒක භාෂික (සිංහල) බස් රථ ගණන | ද්වි භාෂික ප්‍රතිශතය | ඒක භාෂික (සිංහල) ප්‍රතිශතය |
| 196 | 107 | 89 | 55% | 45% |



| නැගෙනහිර පළාත | | | | |
|---|---|---|---|---|
| මුළු බස් රථ ගණන | ද්වි භාෂික බස් රථ ගණන | ඒක භාෂික (දෙමළ) බස් රථ ගණන | ද්වි භාෂික ප්‍රතිශතය | ඒක භාෂික (දෙමළ) ප්‍රතිශතය |
| 459 | 455 | 04 | 99% | 1% |




| වයඹ පළාත | | | | |
|---|---|---|---|---|
| මුළු බස් රථ ගණන | ද්වි භාෂික බස් රථ ගණන | ඒක භාෂික (සිංහල) බස් රථ ගණන | ද්වි භාෂික ප්‍රතිශතය | ඒක භාෂික (සිංහල) ප්‍රතිශතය |
| 390 | 351 | 39 | 90% | 10% |



| මධ්‍යම පළාත | | | | |
|---|---|---|---|---|
| මුළු බස් රථ ගණන | ද්වී භාෂික බස් රථ ගණන | ඒක භාෂික (සිංහල) බස් රථ ගණන | ද්වී භාෂික ප්‍රතිශතය | ඒක භාෂික (සිංහල) ප්‍රතිශතය |
| 589 | 492 | 97 | 84% | 16% |




| ඌව පළාත | | | | |
|---|---|---|---|---|
| මුළු බස් රථ ගණන | ද්වී භාෂික බස් රථ ගණන | ඒක භාෂික (සිංහල) බස් රථ ගණන | ද්වී භාෂික ප්‍රතිශතය | ඒක භාෂික (සිංහල) ප්‍රතිශතය |
| 339 | 288 | 51 | 85% | 15% |



| සබරගමුව පළාත | | | | |
|---|---|---|---|---|
| මුළු බස් රථ ගණන | ද්වි භාෂික බස් රථ ගණන | ඒක භාෂික (සිංහල) බස් රථ ගණන | ද්වි භාෂික ප්‍රතිශතය | ඒක භාෂික (සිංහල) ප්‍රතිශතය |
| 697 | 584 | 113 | 84% | 16% |




| බස්නාහිර පළාත | | | | |
|---|---|---|---|---|
| මුළු බස් රථ ගණන | ද්වි භාෂික බස් රථ ගණන | ඒක භාෂික (සිංහල) බස් රථ ගණන | ද්වි භාෂික ප්‍රතිශතය | ඒක භාෂික (සිංහල) ප්‍රතිශතය |
| 972 | 906 | 66 | 93% | 7% |



| දකුණු පළාත | | | | |
|---|---|---|---|---|
| මුළු බස් රථ ගණන | ද්වී භාෂික බස් රථ ගණන | ඒක භාෂික (සිංහල) බස් රථ ගණන | ද්වී භාෂික ප්‍රතිශතය | ඒක භාෂික (සිංහල) ප්‍රතිශතය |
| 693 | 685 | 08 | 99% | 1% |




සමස්තයක් වශයෙන් දිවයින පුරා සමීක්ෂණයට ලක් කළ මුළු පෞද්ගලික බස් රථ සංඛ්‍යාව 4961 ක් ලෙස දැක්විය හැකි ය. ඉන් ද්වි භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වන බස් රථ සංඛ්‍යාව 4396 ක් තරම් බහුතර ප්‍රමාණයක් වන අතර 565 ක තරම් සුළු බස් රථ සංඛ්‍යාවක ද්විභාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක නොවන අයුරු නිරීක්ෂණය විය. එකී තත්ත්වය ප්‍රතිශතයක් වශයෙන් පහත පරිදි දැක්විය හැකි ය.




ඒ ඒ පළාත්හි පෞද්ගලික බස් රථවල ද්විභාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීම කෙසේ සිදුවී ඇතිද යන්න තවදුරටත් විග්‍රහ කිරීමේ දී, සියලුම පළාත්වල ද්විභාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීමේ යම් සාධනීය ප්‍රවණතාවක් දැකිය හැකිය. එහිදී උතුරු මැද පළාතේ පමණක් 55% ක් තරම් ප්‍රතිශතයක එකී ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වී ඇති අතර අනෙක් සියලුම පළාත්වල 80% වඩා වැඩි ප්‍රමාණයකින් ද්වී භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වී ඇත.

## සමස්ත ලංකා පෞද්ගලික බස් රථ ප්‍රමාණය සවිස්තරාත්මකව



## පෞද්ගලික බස් රථයන්හි (පළාත් තුළ) ද්විභාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීම

## දත්ත විශ්ලේෂණය

| පළාතෙහි නම | සමීක්ෂණයට ලක් කළ මුළු බස් රථ ගණන | ඒක භාෂික (සිංහල හෝ දෙමළ) නාම පුවරු සහිත බස් රථ ගණන | ද්වි භාෂික නාම පුවරු සහිත බස් රථ ගණන |
|---|---|---|---|
| උතුර | 593 | 95 (දෙමළ) | 498 |
| උතුරු මැද | 146 | 70 (සිංහල) | 76 |
| නැගෙනහිර | 274 | 02 (දෙමළ) | 272 |
| වයඹ | 302 | 33 (සිංහල) | 269 |
| මධ්‍යම | 483 | 93 (සිංහල) | 390 |
| ඌව | 339 | 51 (සිංහල) | 288 |
| සබරගමුව | 565 | 113 (සිංහල) | 452 |
| බස්නාහිර | 627 | 58 (සිංහල) | 569 |
| දකුණ | 571 | 08 (සිංහල) | 563 |

## පෞද්ගලික බස් රථයන්හි (අන්තර් පළාත්) ද්විභාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීම

## දත්ත විශ්ලේෂණය

| පළාතෙහි නම | සමීක්ෂණයට ලක් කළ මුළු බස් රථ ගණන | ද්වි භාෂික නාම පුවරු සහිත බස් රථ ගණන | ඒක භාෂික (සිංහල හෝ දෙමළ) නාම පුවරු සහිත බස් රථ ගණන |
|---|---|---|---|
| උතුර | 33 | 30 | 03 (සිංහල) |
| උතුරු මැද | 50 | 31 | 19 (සිංහල) |
| නැගෙනහිර | 185 | 183 | 02 (සිංහල) |
| වයඹ | 88 | 82 | 06 (සිංහල) |
| මධ්‍යම | 106 | 102 | 04 (සිංහල) |
| සබරගමුව | 132 | 132 | 00 (සිංහල) |
| බස්නාහිර | 345 | 337 | 08 (සිංහල) |
| දකුණ | 122 | 122 | 00 (සිංහල) |

## ප්‍රධාන බස් නැවතුම් මධ්‍යස්ථාන - පෞද්ගලික

දිවයින පුරා තෝරා ගත් ප්‍රධාන පෞද්ගලික බස් නැවතුම් මධ්‍යස්ථාන 15 ක පමණ ද්විභාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වී මපිළිබඳව සමීක්ෂණය කළ අතර එහි නිරීක්ෂණය පහත පරිදි වේ.

| ප්‍රධාන බස් නැවතුම් මධ්‍යස්ථානයට | සමීක්ෂණයට ලක් කළ මුළු බස් රථ ගණන | ද්වි භාෂික නාම පුවරු සහිත බස් රථ ගණන | ඒක භාෂික (සිංහල හෝ දෙමළ) නාම පුවරු සහිත බස් රථ ගණන |
|---|---|---|---|
| රත්නපුර | 420 | 328 | 92 |
| මඩකලපුව | 27 | 27 | 00 |
| ත්‍රිකුණාමලය | 14 | 14 | 00 |
| කුරුණෑගල | 316 | 301 | 15 |
| වව්නියාව | 190 | 114 | 76 |
| අම්පාර | 123 | 121 | 02 |
| මොණරාගල | 109 | 88 | 21 |
| නුවර එළිය | 68 | 64 | 04 |
| මාතර | 242 | 241 | 01 |
| බදුල්ල | 122 | 106 | 16 |
| ගාල්ල | 303 | 303 | 00 |
| කොළඹ කොටුව | 318 | 314 | 04 |
| ගම්පහ | 165 | 154 | 11 |
| කිලිනොච්චිය | 103 | 93 | 10 |
| යාපනය | 113 | 110 | 03 |

## ප්‍රධාන බස් නැවතුම් මධ්‍යස්ථාන - පෞද්ගලික




ප්‍රධාන බස් නැවතුම් මධ්‍යස්ථාන (පෞද්ගලික ) නිරීක්ෂණයේදී අනාවරණය වූ කරුණු කිහිපයකි. එනම්, සමස්තයක් ලෙස සමීක්ෂණයට භාජනය කළ සියලුම පෞද්ගලික බස් නැවතුම් මධ්‍යස්ථානවල ද්වි භාෂා ප්‍රතිපත්තිය සාධනීය ලෙස ක්‍රියාත්මක වී තිබිණි. එහිදී මඩකලපුව, ත්‍රිකුණාමලය හා ගාල්ල යන බස් නැවතුම් මධ්‍යස්ථානයන් හි ද්වි භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීම 100% ක් ව පැවති අතර කුරුණෑගල, අම්පාර, මොණරාගල, නුවර එළිය, මාතර, බදුල්ල, කොළඹ කොටුව, ගම්පහ, කිලිනොච්චිය හා යාපනය යන නැවතුම් පොළවල් හි 80% කට වැඩි ප්‍රතිශතයකින් ද්වි භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වී තිබුණි. වව්නියාව හා රත්නපුර යන බස් නැවතුම් පොළවල් හි ද්වි භාෂා ප්‍රතිපත්තිය 60% කට වැඩි ප්‍රමාණයකින් ක්‍රියාත්මක වී තිබිණි.

ශ්‍රී ලංකාවේ ලංගම හා පෞද්ගලික යන සියලුම බස් රථවල ද්වී භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීම පහත අයුරින් ප්‍රස්ථාර ගත කළ හැකිය.




මෙහිදී සියලුම බස් රථවල ද්වී භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීමේ ප්‍රතිශතය 83% ක් තරම් සාධනීය ප්‍රමාණයක් බවත් 17% ක් තරම් ප්‍රමාණයක ද්වී භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක නොවන බවත් හඳුනා ගත හැකිය.

සමස්ත ලංකා බස් රථවල පළාත් වශයෙන් ද්වි භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වන අයුරු පහත පරිදි වේ.




ශ්‍රී ලංගම - 1779 (29%)

පළාත් බස් රථ (පෞද්ගලික) - 3377 (57%)

අන්තර් පළාත් බස් රථ (පෞද්ගලික) - 1019 (16%)

සමස්ත ලංකා බස් රථවල පළාත් වශයෙන් ද්වී භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක නොවීම පහත පරිදි වේ.




ශ්‍රී ලංගම - 692 (55%)

පළාත් බස් රථ (පෞද්ගලික) - 523 (42%)

අන්තර් පළාත් බස් රථ (පෞද්ගලික) - 42 (3%)

# සමස්ත ලංකා දුම්රිය නැවතුම් පොළවල්හි නිවේදන කටයුතුවල ද්විභාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීම

## දත්ත විශ්ලේෂණය

| උතුරු පළාත | | | | |
|---|---|---|---|---|
| දුම්රිය ස්ථාන ගණන | ද්වි භාෂික නිවේදන | එක භාෂික (සිංහල) නිවේදන | ද්වි භාෂික ප්‍රතිශතය | ඒක භාෂික (සිංහල) ප්‍රතිශතය |
| 01 | 03 | 07 | 30% | 70% |




| උතුරු මැද පළාත | | | | |
|---|---|---|---|---|
| දුම්රිය ස්ථාන ගණන | ද්වි භාෂික නිවේදන | එක භාෂික (සිංහල) නිවේදන | ද්වි භාෂික ප්‍රතිශතය | ඒක භාෂික (සිංහල) ප්‍රතිශතය |
| 05 | 14 | 04 | 78% | 22% |



| නැගෙනහිර පළාත | | | | |
|---|---|---|---|---|
| දුම්රිය ස්ථාන ගණන | ද්වි භාෂික නිවේදන | එක භාෂික (සිංහල) නිවේදන | ද්වි භාෂික ප්‍රතිශතය | ඒක භාෂික (සිංහල) ප්‍රතිශතය |
| 04 | 12 | 05 | 71% | 29% |




| වයඹ පළාත | | | | |
|---|---|---|---|---|
| දුම්රිය ස්ථාන ගණන | ද්වි භාෂික නිවේදන | එක භාෂික (සිංහල) නිවේදන | ද්වි භාෂික ප්‍රතිශතය | ඒක භාෂික (සිංහල) ප්‍රතිශතය |
| 04 | 15 | 42 | 74% | 26% |



| මධ්‍යම පළාත | | | | |
|---|---|---|---|---|
| දුම් රිය ස්ථාන ගණන | ද්වි භාෂික නිවේදන | එක භාෂික (සිංහල) නිවේදන | ද්වි භාෂික ප්‍රතිශතය | ඒක භාෂික (සිංහල) ප්‍රතිශතය |
| 03 | 11 | 11 | 50% | 50% |




| ඌව පළාත | | | | |
|---|---|---|---|---|
| දුම් රිය ස්ථාන ගණන | ද්වි භාෂික නිවේදන | එක භාෂික (සිංහල) නිවේදන | ද්වි භාෂික ප්‍රතිශතය | ඒක භාෂික (සිංහල) ප්‍රතිශතය |
| 01 | 00 | 03 | 0% | 100% |



| සබරගමුව පළාත | | | | |
|---|---|---|---|---|
| දුම් රිය ස්ථාන ගණන | ද්වි භාෂික නිවේදන | එක භාෂික (සිංහල) නිවේදන | ද්වි භාෂික ප්‍රතිශතය | ඒක භාෂික (සිංහල) ප්‍රතිශතය |
| 01 | 02 | 19 | 10% | 90% |




| බස්නාහිර පළාත | | | | |
|---|---|---|---|---|
| දුම් රිය ස්ථාන ගණන | ද්වි භාෂික නිවේදන | එක භාෂික (සිංහල) නිවේදන | ද්වි භාෂික ප්‍රතිශතය | ඒක භාෂික (සිංහල) ප්‍රතිශතය |
| 09 | 138 | 483 | 22% | 78% |



| දකුණු පළාත | | | | |
|---|---|---|---|---|
| දුම් රිය ස්ථාන ගණන | ද්වි භාෂික නිවේදන | එක භාෂික (සිංහල) නිවේදන | ද්වි භාෂික ප්‍රතිශතය | ඒක භාෂික (සිංහල) ප්‍රතිශතය |
| 04 | 40 | 62 | 39% | 61% |




සමස්තයක් ලෙස දිවයින පුරා සියලුම පළාත් ආවරණය වන පරිදි දුම්රිය ස්ථාන 32 ක නිවේදන කටයුතුවල ද්වි භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීම පිළිබඳව නිරීක්ෂණය කෙරිණි. ඉන් නිවේදන 235 ක ද්වි භාෂාවෙන් නිවේදන කටයුතු කෙරෙන අතර නිවේදන 636 ක ද්වි භාෂාවෙන් නිවේදන කටයුතු නොකරන බැව් ප්‍රත්‍යක්ෂ විය. මීට අමතරව ඌව පළාතේ නිරීක්ෂණය කෙරුණු දුම්රිය ස්ථානයේ ද්වි භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක නොවීම විශේෂ කරුණකි.

උක්ත සංඛ්‍යා ප්‍රතිශතයක් ලෙස දැක්වීමේදී මධ්‍යම, නැගෙනහිර හා උතුර යන පළාත් වල පිළිවෙළින් 50%, 71% හා 78% යන අගයන් හඳුනා ගැනුණි. අනෙකුත් සියලුම පළාත්වල 50% ට අඩු ප්‍රතිශතයකින් ද්වි භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වී ඇති මුත් ඌව පළාතේ ද්වි භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක නොවීම විශේෂ කරුණකි. මේ අනුව සමස්ත ලංකා දුම්රිය නිවේදනයන් හි ද්වි භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීම ප්‍රතිශතයක් ලෙස පහත පරිදි දැක්විය හැකිය.



මීට අමතරව දිවයින පුරා දුම්රිය ස්ථානවල සාමාන්‍ය නිවේදන කටයුතු ද්වී භාෂාවෙන් සිදු වන අයුරු ප්‍රතිශතයක් ලෙස සලකා බැලීමේදී 11% ක තරම් අවම ප්‍රමාණයකින් ද්වී භාෂාවෙන් සිදු වන අතර 89% ක් පමණ සාමාන්‍ය නිවේදන කටයුතු තවමත් සිදු වන්නේ ඒක භාෂිකව (සිංහල) බැව් පැහැදිලි විය.




විශේෂ නිවේදන කටයුතු පිළිබඳව කළ සමීක්ෂණයේදී දිවයින පුරා දුම්රිය ස්ථානවල ද්වී භාෂාවෙන් කටයුතු කෙරෙන්නේ 1% ක තරම් ඉතා සුළු ප්‍රමාණයක් බවත් ඉතිරි 99% ක් තරම් ප්‍රමාණය තවමත් නිවේදන කටයුතු කෙරෙන්නේ එක භාෂිකව (සිංහල) බැව් නිරීක්ෂණය විය.



## ප්‍රධාන දුම්රිය ස්ථාන



## සමස්ත ලංකා දුම්රිය නිවේදන ප්‍රමාණය සවිස්තරාත්මකව







# භාෂා හා
## සංස්කෘතික සබඳතා තහවුරු කිරීම

ගැටුමේ දරුණුම ප්‍රතිපලවලට මුහුණ දුන්නේ සියලුම ජනවර්ගවල තරුණ පිරිස් ය. එහෙයින් ඔවුන්ට විශේෂ වැඩකොටසක් කළ හැකි ය. ලේ වැගිරවීමට මිස ඔවුන් එකිනෙකා මුණ ගැසී නැත. අන්‍යොන්‍ය අවබෝධයක් ලැබීමට ඔවුන්ට ඉඩක් හෝ වෙලාවක් ලැබී නැත''

උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිසමේ ''ජනවර්ග අතර අන්‍යොන්‍ය සබඳතාව'' ඡේදනය යටතේ එසේ දැක් වෙයි. දුරස්තව ජීවත්වීම නිසා ඇති වූ සමාජමය බෙදීමත් සංහිඳියාව ගොඩ නැගීමේ ක්‍රියාමාර්ගයත් එහි දී අවධානයට ලක් කෙරේ. සිවිල් සමාජ කණ්ඩායම්වල සහයෝගය ද ලබා ගනිමින් හුවමාරු වැඩ සටහන් පුළුල් අයුරින් ක්‍රියාත්මක කිරීම උචිත යැයි *LLRC* වාර්තාව (9.281) නිර්දේශ කරයි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය 2007 වසරේ දී ශිෂ්‍ය හුවමාරු වැඩ සටහන් ආරම්භ කරන විට ඒ පිළිබඳ රජයට හෝ වෙනත් ආයතනවලට අවබෝධයක් නොවී ය. එහෙත් එය සිංහල හා දෙමළ සිසු ප්‍රජාව තුළ මහත් පිබිදීමක් ඇති කිරීමට සමත් විය. රජය විසින් ''තල් අරඹයි පොල් අරඹයි'' වැනි වැඩසටහන් ආරම්භ

කරන ලද්දේ එයින් කලකට පසුව ය. කෙසේ වුව ද උගත් පාඩම් කොමිසමේ අවධානයට ලක් වූ හුවමාරු වැඩසටහන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මගින් සංවිධානය කිරීමේ දී පූර්ව අතදැකීම් ද ප්‍රයෝජනවත් විය.

ඒ අනුව 2012 වසරේ දී කන්තලේ, පානම හා යාපනය යන ප්‍රදේශ කේන්ද්‍ර කර ගනිමින් දෙමළ, සිංහල හා මුස්ලිම් ජනවර්ග නියෝජනය කෙරුණු හුවමාරු වැඩසටහනක් සාර්ථකව දියත් කිරීමට හැකි විය. එහි දී සිදු වූයේ සිංහල, දෙමළ හා මුස්ලිම් ජාතිකයන්ගේ නෑ ගමනකි. සිංහල මිතුරන් දෙමළ නිවෙස්වල දිනක් රැඳෙමින් ඔවුන්ගේ ආහාර සංස්කෘතිය, ඇවතුම් පැවතුම් හා වින්දන මාර්ග උකහා ගන්නා විට දෙමළ මිතුරන් සිංහල මිතුරන්ගේ නිවාසවලින් ද එම අත්දැකීම් බෙදා ගනී. මුස්ලිම් මිතුරන් සම්බන්ධයෙන් ද එය එසේ ම ය.

''ජාතීන් වශයෙන් වෙනස් වුණාට අපි හදවත්වලින්, සිතුම් පැතුම් අතින් සමානයි. එකට බැඳිලා බන්නේ. ඒ හැඟීම යි මෙයින් ඉස්මතු වෙන්නේ'' පානම සංස්කෘතික වැඩ සටහනට ආශිර්වාද කරමින් පානම චන්ද්‍රරතන හිමියෝ පැවසූ හ.

කෙසේ වුව ද මේ වැඩ සටහන් දියත් කරන්නට සිදු වූයේ ආරක්ෂක අංශවල ප්‍රශ්න කිරීම හා පීඩාකාරී බාධා මැද්දේ ය.








# විලාසම

## ලිපිනය අහිමි වතු ජනයාට ලිපිනයක්



ලයින් කාමර කියන නම වෙනස් වෙලා කෙනෙකුගේ ගෞරවයට පාත්‍රවන නිවාසයක් බවට පත්වෙලා නිවසට නමක්, අංකයක් සහ ලිපිනයක් ලැබෙන එක කොච්චර සතුටක් ද ඒ අයට”

**- නඩේශන් සුරේෂ්** - ඌව ශක්ති පදනමේ සභාපති

වතුකම්කරු පවුල් සඳහා ස්ථිර ලිපිනයක් ලබාදීමේ සමාජ සත්කාරය දියත් වූයේ 2013 ජූලි මස දී ය. පස්සර ප්‍රදේශීය සභා බල ප්‍රදේශයෙහි මෙය ක්‍රියාත්මක විය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සහය ඇතිව ඌව ශක්ති පදනම විසින් මෙය ක්‍රියාත්මක කරන ලදි. අනුග්‍රහය ලැබුණේ ඕස්ට්‍රේලියානු මහ කොමසාරිස් කාර්යාලයෙහි. පුරවැසියන් 3000 කට පමණ මෙයින් සේවය සැලසිණි. නිශ්චිත ලිපිනයක් නොමැති වීම හේතුවෙන් ලිපි ලැබීමේ අවිධිමත්

භාවය නිසා පීඩා විඳි වතු කම්කරුවන් හට ස්ථිර ලිපිනයක් ලැබීම හා එම ලිපිනයට නියමිත පරිදි සාමාන්‍ය තැපැල් ක්‍රමය යටතේ ම ලියුම් ලැබීම මෙයින් අත් වූ ප්‍රතිලාභය යි.

බොහෝ ලයින් කාමරවලට අංකයක් පවා නොමැති නිසා එකම නම ඇති වෙනත් අයකු හට වැරදීමෙන් ලිපි බෙදා දීම, ලිපි බෙදීම සිදු කරන වතු කම්කරු කණ්ඩායමේ පරීක්ෂක තනතුර (සුපර්වයිසර්) දරන්නාගේ හිතවත් බව හෝ විරසකය මත ලිපි ලැබීම තීන්දු වීම, ලිපි අස්ථානගත වීම යනාදී හේතු මත වතු කම්කරුවෝ ඉතා දිගු කාලයක් විවිධ ගැටලුවලට මුහුණ දුන්හ. ඔවුන්ගේ අනන්‍යතාවට ගරු කිරීම 'විලාසම' වැඩ සටහනේ අරමුණ විය. පස්සර ප්‍රාදේශීය සභාව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ පොලීසිය ඇතුළු ආයතන ගණනාවකගේ සහයෝගය මීට ලැබුණි. මේ වැඩ සටහන සමස්ත වතුකරයේ ජනතාව සඳහා ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව වටහාගෙන සිටින විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඊට සුදුසු පියවර ගනිමින් සිටී.



''වතු වගාව සඳහා ඉන්දියාවෙන් ගෙන්වන ලද ජන පිරිසෙහි හතර වැනි පරම්පරාවයි අප නියෝජනය කරන්නේ. මෙ පමණ කාලයක් ආත්ම ගෞරවයක් ඇති ව ජීවත්වීමේ අවස්ථාව අපට ලැබී නැහැ. හේතුව අපට මනුෂ්‍යයන් හැටියට නොසැලකීම යි. මේ නිසා පරම්පරා ගණනාවක් අපේ ජනතාව මහා වේදනාවක් වින්දා. මේ වේදනාව කවුරුත් තේරුම් ගත්තු එක සැනසීමට කරුණක්. අපට නිවැරදි ලිපිනයක් ස්ථිර කර දෙමින් පාසැලට ද තැපැල් පෙට්ටියක් ලැබුණේ එ නිසයි''

- **එස්. ප්‍රියා** සිසුවිය







# පුරවැසි සභාව

## පුරවැසියන් බලගැන්වීමේ ප්‍රවේශයක්

අප වසර තුනක කාලයක් තිස්සේ භාෂා සංගම්වල ක්‍රියාකාරිත්වය ඉදිරියට ගෙන යමින් ද පසු විපරම ඔස්සේ සාධනීය පියවර ගනිමින් ද සිටී. එහි දී නිරීක්ෂණයට ලක් වූ ලක්ෂණයක් වන්නේ භාෂා සංගම්වල ක්‍රියාකාරිත්වය එක්තරා දුරකට යාමේ දී සීමා වන බවයි. භාෂා සංගමයක ක්‍රියාකාරිත්වය හුදෙකලාව ඉදිරියට ගෙන යා හැකි ද යන අභියෝගය එහි දී මතු වේ. සමාජයේ පවතින භාෂා අයිතිවාසිකම් පිළිබඳ ගැටලුව සංයුක්ත ගැටලුවක් ලෙස ගැනීමේ අවශ්‍යතාව එහි දී ඉස්මතු වේ. භාෂාව සංස්කෘතියේ කැටපතකි. භාෂා ගැටලුව ජන සංස්කෘතියේ අනෙකුත් අංග සමග ද ගැට ගැසී පවතී. සමාජයේ පවතින පසුගාමී තත්ත්වයන්, සම්පත් ඌනතාව, දරිද්‍රතාව සහ සෘණ ආකල්ප යනාදී කරුණු ගණනාවක් සමග භාෂා අයිතිවාසිකම් පිළිබඳ ගැටලුව සම්බන්ධ වෙයි. සක්‍රීය වූ පුරවැසි ක්‍රියාකාරිත්වයක යාන්ත්‍රණය වැදගත් වන්නේ එවිට ය. පුරවැසි සභා ව්‍යුහයක් ගොඩ නැඟීම ආරම්භ වන්නේ එතැන් පටන් ය.

ගම තුළ ක්‍රියාත්මක වන විවිධ සිමිති සංවිධානවලට අයත් උද්යෝගිමත් සාමාජිකයෝ, නිදහස් බුද්ධිමත්හු, ප්‍රදේශයේ රාජ්‍ය නිළධාරීහු, පූජකවරු, තරුණ හා කාන්තා සමාජ ක්‍රියාකාරිකයෝ පුරවැසි සභාව නියෝජනය කරති. පුරවැසි කතිකාවතක් ඔස්සේ ගම තුළ නව චින්තනයක් ද, නිර්මාණශීලි ක්‍රියාකාරිත්වයක් මගින් ගැමි ජන දිවිය ප්‍රවර්ධනය කිරීම ද මෙයින් අපේක්ෂා කෙරේ. ගමේ සම්පත් අධ්‍යයනය මෙන් ම ගමට ඔබින සංවර්ධන සැලැස්ම සකස් කිරීම ද සිදු කරනු ලබන්නේ පුරවැසි සභාව විසිනි. මේ සංවර්ධන සැලැස්ම, පළාත් පාලන ආයතන, ප්‍රාදේශීය ලේකම් ඇතුළු වගකිව යුතු ආයතන වලට ලබාදීම හා ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා බලපෑම් කිරීම පුරවැසි සභාවේ කාර්යයයි. පුරවැසි සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන රාජ්‍ය ව්‍යාපෘතිවල විනිවිද භාවය පිළිබඳ විමසිල්ලෙන් පසුවීම පුරවැසි සාභාවේ වගකීම වේ. පුරවැසි සභාව තුළ ඇත්තේ ස්වයං නියාමනයකි. 'අදහස් රැසක් - එක සම්මුතියක්' යනු එහි දර්ශනයයි.

පුරවැසි සභාවෙහි කමිටු පහක් ක්‍රියාත්මක වේ. ඒවා නම්

- පරිසරය හා මිනිසා
- යහ පාලනය
- භාෂා හා සංස්කෘතික ප්‍රවර්ධනය
- තරුණ දායකත්වය
- කාන්තා හා ළමා

මේ සෑම කමිටුවකට ම අනන්‍ය වූ කාර්ය භාරයක් පවතී. ප්‍රදේශයෙහි භූගෝලීය හා ජීවන පරිසරය අනුව අවශ්‍යතා හඳුනාගෙන ගමට ඔබින වැඩ සටහන් සැලසුම් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ හැකියාව කමිටුවල පවතී.

මේ අනුව දැනට පවතින භාෂා සංගම් පුරවැසි සභාවේ භාෂා හා සංස්කෘතික කමිටුව බවට පත් කළ හැකි ය. එවිට එම භාෂා සංගමයේ ක්‍රියාකාරිත්වය සීමා වූ තැනින් ඔබ්බට යයි. භාෂා අයිතිවාසිකම් කඩවීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක වූ භාෂා සංගමය ගමට ආවේණික වූ සංස්කෘතිකාංග ප්‍රවර්ධනය කරන, භාෂා හා සංස්කෘතික විවිධත්වයට මග සලසන ක්‍රියාන්විතයක් බවට පත් වෙයි. පුරවැසි සභාව නිර්මාණය කිරීමේ දී වරිග සභා හා අත්තම වැනි දේශීය සම්ප්‍රදායන්ගෙන් ද, පංචායත් ක්‍රම වැනි එතෙර සම්ප්‍රදායන්ගෙන් ද ආභාසයක් ලබා ඇතත් මෙය මුළුමනින් ම අලුත් අදහසකි. පුරවැසි සභාවේ කාර්යභාරය, සංයුතිය හා එහි දිශානතිය, ඒ ඒ පුරවැසි සභාවන්හි අනන්‍යතාව අනුව තීන්දු විය හැකි ය. පිරිහුණු රාජ්‍ය තන්ත්‍රයක ක්‍රියාකාරිත්වය අභිමුව පුරවැසියාගේ පසුගාමිත්වය සමාජයේ ඉදිරි ගමනට බාධාවක් ව ඇති අවධියක පුරවැසි සභාව පුරවැසියා බල ගැන්වීමේ මඟකට අවතීර්ණ වෙයි. එකිනෙකා පිළිබඳ ගරුත්වය, සම්පත් බෙදා හදා ගැනීම, සහජීවනය, සහනශීලි පැවැත්ම පිළිබඳ නව දැක්මක් පුරවැසි සභාව ඔස්සේ ප්‍රජාව තුළින් මතු කළ හැකි ය. චිරන්තන සම්ප්‍රදායන්ගෙ න් ආලෝකයක් ලබා ගැනීම ද නවීනත්වයේ සාරවත් සම්ප්‍රදායන් උකහා ගැනීම ද පුරවැසි සභාවේ ශක්තිය ඉහළ නංවන සාධකයක් වනු ඇත.

2014 දෙසැම්බර් වන විට දිවයිනේ දිස්ත්‍රික්ක 15 ක පිහිටුවා ඇති පුරවැසි සභා සංඛ්‍යාව 200 කට ආසන්න ය. ඇතැම් පුරවැසි සභා නිර්මාණය වෙමින් පවතී. ඇතැම් පුරවැසි සභා සක්‍රිය ව ඉදිරියට යමින් පවතී.

# යෝජනා හා නිර්දේශ

1. භාෂා අයිතිවාසිකම් හා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන, රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ සහ කැබිනට් තීරණ යනාදිය අ.පො.ස. සාමාන්‍ය පෙළ භාෂා විෂයට අදාළ විෂය නිර්දේශයට ඇතුළත් කිරීම සහ සාමාන්‍ය පෙළ විභාගයේ දී එම කරුණු ආශ්‍රිත ව ප්‍රශ්න ඇතුළත් කිරීම. ජාතික අධ්‍යාපන ආයතනය හා භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය උක්ත කාරණය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් කඩිනම් පියවර ගැනීම.

2. භාෂාව සහ සංස්කෘතිය සම්බන්ධයෙන් මධ්‍යම ආණ්ඩුවේ විෂය පථයන් පළාත් සභාවල රේඛීය අමාත්‍යාංශ විෂය පථයන්ට ඇතුළත් කිරීම හා අය වැය ලේඛනයෙන් එම විෂය පථයන්ට අදාළ මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම.

3. පළාත් පාලන ආයතනවල ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ දී ද්වී භාෂා ප්‍රතිපත්තිය අනුව කටයුතු කිරීමට අදාළ කොන්දේසි ව්‍යාපාර බලපත්‍රයට ඇතුළත් කිරීම.

4. සිංහල මාධ්‍ය පාසල්වල විෂය නිර්දේශ අනුව සැකසුණු පෙළ පොත්වල දෙමළ ලේඛකයන්ගේ උසස් ගණයේ කෘතිවල කොටස් ද ඇතුළත් කිරීම. දෙමළ මාධ්‍ය පාසල්වල පෙළ පොත් වලට ද එපරිද්දෙන් ම උසස් සිංහල ලේඛකයන්ගේ කෘතිවල කොටස් ඇතුළත් කිරීම.

5. සිංහල සාහිත්‍ය කෘති දෙමළ බසට පරිවර්තනය කිරීම හා දෙමළ සාහිත්‍ය කෘති සිංහල බසට පරිවර්තනය කිරීමේ වැඩ සටහන් ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය මගින් ආරම්භ කිරීම. දෙමළ සිංහල සාහිත්‍ය උලෙළක් එම අමාත්‍යාංශය මගින් වාර්ෂික ව සංවිධානය කිරීම.

6. ප්‍රතිසංධානාත්මක ජාතික භාෂා සංගණනයක් ඔස්සේ දිගු කාලීන හා කෙටි කාලීන විසඳුම් කරා යා හැකි වන හෙයින් රාජ්‍ය ආයතන භාෂා සංගනනයට ලක් කිරීම. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් එයට ක්‍රියාත්මක කිරීම.

7. සිංහල හා දෙමළ භාෂා උගන්වන ගුරුවරුන් සඳහා ගුරු පුහුණු විද්‍යාලයක් පිහිටුවීම.

8. භාෂා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීමෙහිලා මාධ්‍ය ආයතන සතුව ඇති පුළුල් වගකීම් තේරුම් ගනිමින් මාධ්‍යවේදීන් ඉලක්ක කර ගත් පුහුණු වැඩ සටහන් දියත් කිරීම.

9. වෙළෙඳ සමාගම් මගින් ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීම් පුවරුවල සඳහන් කරුණු භාෂා තුනෙන් ම ඇතුළත් කරන ලෙස පාරිභෝගික අධිකාරිය විසින් එම සමාගම්වලට දැනුම් දෙනු ලැබීම.

10. රාජ්‍ය භාෂා කොමිසමේ නියෝග පිළිපැදීම සහතික කිරීම සඳහා එම නියෝග බල ගැන්වීමේ විධි විධාන ශක්තිමත් කිරීම.

11. රාජ්‍ය භාෂා කොමිසමේ කාර්ය භාරය අගනුවර කේන්ද්‍රගතව පවතින හෙයින් එහි වගකීම් ප්‍රාදේශීය මට්ටමින් ඉටු කිරීම සඳහා පියවර ගැනීම.

12. පාසල් සඳහා පෙළ පොත් සම්පාදනයේ දී සිංහල දෙමළ සහජීවනය පළුදු කෙරෙන උපුටා ගැනීම් ඉවත්කර සංහිඳියාවට තුඩු දෙන ලේඛන ඇතුළත් කිරීම.

13. උසස් පෙළ සිංහල සාහිත්‍ය ග්‍රන්ථ සඳහා දෙමළ කෙටිකතාකරුවන්ගේ සහ කවීන්ගේ නිර්මාණ ඇතුළත් කිරීම. මේ ක්‍රමවේදය දෙමළ සාහිත්‍ය පාඨ ග්‍රන්ථ සඳහා ද අනුගමනය කිරීම.

14. උසස් අධ්‍යාපන ආයතනවල සිංහල මාධ්‍යයෙන් පමණක් පැවැත්වෙන පාඨමාලා දෙමළ මාධ්‍යයෙන් ද පැවැත් වීම. උදා: කොළඹ විශ්වවිද්‍යාලයේ පුස්තකාල ඒකකයේ පවත්වනු ලබන පාඨමාලා සිංහල මාධ්‍යයට පමණක් සීමා වීම.

15. පරිවර්තනය විෂය පිළිබඳ උපාධිය ඕනෑම අයෙකුට හැදෑරීම සඳහා, විවෘත විභාගයක් ඔස්සේ එම පාඨමාලාවට ඇතුළත් වීමේ අවස්ථාව ලබාදීම. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය ඒ වෙනුවෙන් කටයුතු කිරීම සඳහා කඩිනම් පියවර ගැනීම.

16. සිංහල හා දෙමළ භාෂාව ඉගැන්වීම සඳහා මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යවල ඉඩකඩ සලසා දීම.

17. මානව හිමිකම් කොමිසම හා රාජ්‍ය භාෂා කොමිසමට ඉදිරිපත් වුණු නඩුවල ප්‍රගතිය සමාලෝචනය කිරීමේ යාන්ත්‍රනය ඇති කිරීම.

18. සිංහල හා දෙමළ භාෂා පරිවර්තකයන් පුහුණු කිරීම සඳහා විධිමත් ආයතනයක් ඇති කිරීම.

19. මාර්ග නීති කඩවීම සම්බන්ධයෙන් දඩ කොළ නිකුත් කිරීමේ දී සිදු කරන ලද වරැද්දට අදාලව අංකයක් භාවිත කිරීම සහ ඒ ඒ වැරැද්ද පිළිබඳ ත්‍රෛභාෂිකව දඩ කොළයේ එක් පසෙක අංක කොට දැක්වීම.